# 8. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ අයවැය කටයුතු

## 8.1 සමස්ත නිරීක්ෂණය සහ ප්‍රතිපත්ති කාර්ය සාධනය

පසුගිය වසර දෙක තුළ දී සාර්ථක ලෙස සිදු කළ අයවැය පරතරය අඩු කර ගැනීම 1998 වසර තුළ දී කළ නොහැකි විය. සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.5 ක් දක්වා අඩු කර ගැනීමටද, වර්තන ගිණුමේ අතිරික්තයක් ජනිත කරලීමටද 1998 අයවැය මගින් අපේක්ෂා කෙරිණි. 1997 අවසන් භාගයේදී ලෝක ආර්ථික කටයුතු පිළිබඳව පැවති දැඩි අවිනිශ්චිතභාවය, දේශීය ආරක්ෂක වියදම් සහ භාණ්ඩ හා සේවා බදු (භා.සේ.බ.) ආදායමෙහි ඇති විය හැකි ප්‍රතිවිපාක ආදිය සැලකීමේදී ඉහත ඉලක්කයන් දැඩි අපේක්ෂා සහගත ඒවා විය. සාර්ථක මූල්‍ය පාලනය, දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට අනුරූපව රජයේ ආදායම වර්ධනය කිරීම, වර්තන වියදම්හි වැඩි වීම සීමා කිරීම, පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල තවදුරටත් ඉදිරියට ගෙන යාම සහ ණය කළමනාකරණය ශක්තිමත් කිරීම ආදිය තුළින් අයවැය පරතරය අඩු කිරීමට අදහස් කෙරිණි. ඒ අතරම යටිතල පහසුකම් අඩු වීම වේගවත් ආර්ථික වර්ධනයකට බාධාවක් වෙමින් පැවතීම නිසා රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.9 ක් දක්වා වැඩි කිරීමට 1998 අයවැය මගින් බලාපොරොත්තු විණි.

සමස්ත අයවැය හිඟය සැලකීමේදී 1998 තුළ රාජ්‍ය මූල්‍ය කටයුතුවල ක්‍රියාකාරිත්වයෙහි පසුබෑමක් දක්නට ලැබිණ. එහෙත්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සැලකීමේදී බදු ව්‍යුහය සම්බන්ධ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, ණය කළමනාකරණය සහ රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ ආදියෙහි ප්‍රගතියක් ඇති විය. සමස්ත අයවැය හිඟය (ප්‍රදානයන්ට පෙර සහ පෞද්ගලීකරණ ලැබීම්වලට පෙර) දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.2 ක් දක්වා වැඩි වුණු අතර මෙය 1998 අයවැය මගින් ඉලක්ක කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.5 හා සසඳනවිට සියයට 2.7 ක සැලකිය යුතු අයවැය අපගමනයකි. තවදුරටත් වර්තන ගිණුමේ අඛණ්ඩවම හිඟ තත්ත්වයක් පැවති අතර එම හිඟය 1997 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2 සිට සියයට 2.4 දක්වා වැඩි විය. ලෝක ආර්ථික අර්බුදය හේතුවෙන් දේශීය ආර්ථිකය තුළ ඇති වුණු පසුබෑම නිසා රජයේ ආදායමට සහ වෙනත් කටයුතුවලට ඇති වන බලපෑම හේතුවෙන් 1998 වර්ෂයේදී මෙම අපගමනය මග හැරීමට නොහැකි වුවද, මෙම අපගමනයෙහි වූ විශාලත්වය කනස්සල්ලට ලක්විය යුතු කරුණකි. එය ආයෝජනය සහ රැකියාජනනය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ පොලී අනුපාතිකයන් අඩු කිරීමට දරූ පරමාර්ථයන් වලක්වන ලදී. අයවැය හිඟය මූල්‍යණය කිරීමට දේශීය සම්පත් සඳහා රජයේ ඉල්ලුම වැඩි වීම පිළිබිඹු කරමින් රජයේ ණය උපකරණවල පොලී අනුපාත සහ ප්‍රමුඛ ණය දීමේ අනුපාත වසර තුළ ඉහළ යෑම ඇරඹිණි. මිල මට්ටම්වල ස්ථායී භාවයට සහ විනිමය වෙළෙඳපළට ඇති විය හැකි අයහපත් ප්‍රතිවිපාක හේතුවෙන් තවදුරටත් මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම මගින් පොලී අනුපාතික ඉහළ යෑම අඩුකරලීමට නොහැකි විය. මෙම තත්ත්වය සමඟ ආර්ථික වර්ධනය පිළිබඳ දුර්වල අපේක්ෂාවන් යටතේ 1999 අයවැය මගින් ඉලක්කගත සමස්ත අයවැය හිඟය සියයට 6 ක මට්ටමක පවත්වා ගැනීම දුෂ්කර බව දක්නට ඇත. 1999 අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.5 ක යථාර්ථවත් මට්ටමක රඳවා ගැනීම සඳහා සුදුසු ක්‍රියා මාර්ගයන් ඉක්මණින් ක්‍රියාත්මක කළයුතු වේ.

සමස්ත අයවැය හිඟය නිරපේක්ෂ අගයයන් අනුව රුපියල් දශ ලක්ෂ 23,086 න් ඉහළ ගොස් රුපියල් දශ ලක්ෂ 93,147 ක් විය. ආරක්ෂක වියදම් ඉහළ යෑම සහ රජයේ ආදායමේ අඩු වීම මෙම මූල්‍ය හිඟය විශාල වීමට හේතුවූ ප්‍රධාන සාධක වේ. අමතර ආරක්ෂක වියදම්, වැඩි වුණු අයවැය හිඟයෙන් සියයට 29 කට දායක වුණි. පිරිවැටුම් බදු/භා.සේ.බ., ආදායම් බදු සහ ආනයන බදු වලින් අපේක්ෂිත ආදායම නොලැබීම වැඩි වුණු හිඟයෙන් සියයට 58 කට දායක විය. මේ අතරම වේතන හා වැටුප්, පාඩු ලබන රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් (ශ්‍රී ලංකා දුම්රිය සහ තැපැල් දෙපාර්තමේන්තුව) වලට කරන ලද පැවරුම් වැනි ආරක්ෂක නොවන අංශවල වියදම්හි වැඩි වීම් ඉහත වැඩි වුණු හිඟයෙන් සියයට 7 කට දායක විය.

1998 දී ලෝක වෙළෙඳපොළේ පැවති අවපාත තත්ත්වය යටතේ විශේෂයෙන්ම බොර තෙල්, තිරිඟු, පොහොර සහ සීනි වැනි ද්‍රව්‍යවල ආනයන මිල මට්ටම්වල සීඝ්‍ර අඩු වීම් හේතුවෙන් ශ්‍රී ලංකාවට අත් වූ වාසිදායක තත්ත්වයන් නිසා අයවැය හිඟය වැඩි වීම නිසා ඇති වන උද්ධමනකාරී බලපෑම පැහැදිලිව විද්‍යාමාන නොවීය. එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල සියයට 9.6 ක අව ප්‍රමාණයක් වුවද ආනයන වටිනාකම පාලනය කිරීමට මෙම ලෝක වෙළෙඳපොළ මිල පහත වැටීම උදව් වූ අතර, මෙය බැංකු පද්ධතිය තුළ සම්පත් විශාල ලෙස ඉතිරි වීමටද හේතු විය. වෙළෙඳ ද්‍රව්‍ය මිල පහත වැටීම සහ සාපේක්ෂ ලෙස පෞද්ගලික අංශයේ ණය දීමේ වර්ධනය අඩු වීම නිසා බැංකු ක්ෂේත්‍රය තුළ ඉතිරි වූ සම්පත්, මගින් පොලී අනුපාත මත අධික පීඩනයක් ඇති නොවන ආකාරයට, වැඩි වුණු අයවැය හිඟයෙන් විශාල ප්‍රමාණයක් මූල්‍යනය කිරීමට හැකි විය.

කෙසේ වුවද, බදු ව්‍යුහය සරල කිරීම, බදු අනුපාතයන් අඩු කිරීම, බදු පදනම වැඩි දියුණු කිරීම සහ බදු ව්‍යුහයේ පාරදෘශ්‍ය බව වැඩි කිරීම අරමුණු කරගත් යෝග්‍ය බදු ප්‍රතිපත්තීන් ප්‍රතිසංස්කරණ කීපයක් 1998 දී ක්‍රියාත්මක කරන ලදී. බදු අනුපාත අඩු කිරීම තුළින් ඉතිරි කිරීම් සහ පෞද්ගලික ආයෝජන වැඩි කිරීමට අදහස් කෙරිණි. බදු ක්‍රමය තුළ සිදු කල ප්‍රධාන ව්‍යුහාත්මක වෙනස්කම වූයේ 1998 අප්‍රියෙල් 1 වැනි දින සිට භාණ්ඩ හා සේවා බද්ද (භා.සේ.බ.) හඳුන්වා දීම වන අතර එමගින් පිරිවැටුම් බදු ක්‍රමය තුළ තිබූ බදු මත බදු අය කිරීම අහෝසි කිරීම,

දේශීය පාරිභෝජනය මත බදු ගෙවීමට සිදු වන අයුරින් සහ අපනයනයන් සඳහා ශුන්‍ය බදු අනුපාතයන් නියම කිරීම් යන අවසන් ස්ථාන මූලධර්ම අනුව බදු ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම අරමුණු කොට ගති. මූලිකවම, පිළියෙල නොකරන ලද කෘෂිකාර්මික නිමැවුම්, පොදු ගමනාගමනය, පොහොර, සිමෙන්ති, ඖෂධ වර්ග සහ ඇතැම් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා.සේ.බ.න් නිදහස් කරන ලදී. අපනයන සැකසීම සඳහා අවශ්‍ය ආනයනික යෙදවුම් පිරිවැටුම් බදු ක්‍රමය යටතේ පැවති සංකීර්ණ පරිපාලනමය ක්‍රියාමාර්ගයෙන් නිදහස් කර එම යෙදවුම් බදු ආපසු ගෙවීමේ ක්‍රමයක් සහිතව හා.සේ.බ. යටතට ගනු ලැබිණ. එම ආනයන මත බදු පියවීම සඳහා දින 45 ක (මෙම කාලසීමාව පසු කාලයකදී දින 60 කට වැඩි කරන ලදී) කාලසීමාවක් මෙම ද්‍රව්‍ය ආනයනකරුවනට ලබා දුනි. බැංකු හා මූල්‍ය සේවාවන් පිරිවැටුම් බදු ක්‍රමය යටතේ නොකඩවා පැවතුණු අතර අරමුදල් සඳහා වූ පිරිවැය අඩු කිරීමේ අරමුණින් ඒවායේ බදු අනුපාතය සියයට 2 සිට තවදුරටත් සියයට 1 දක්වා අඩු කරන ලදී. ආරම්භයේදී හා.සේ.බ. තනි බදු අනුපාතිකයක් ලෙස සියයට 12.5 ක් විය. මෙම බදු අනුපාතය මගින් ලබා ගත් ආදායම පෙර තිබූ පිරිවැටුම් බදු ක්‍රමයට වඩා අඩු වුවත් විශාල ලෙස මහජන පිළි ගැනීමක් ලබා ගැනීම සඳහා ආරම්භයේ දී අඩු බදු අනුපාතිකයක් පැනවීම දූරදර්ශී ක්‍රියාවක් ලෙස සැලකිය හැක.

හා.සේ. බද්ද හඳුන්වා දීමත් සමඟ, ආදායමේ අඩු වීම පියවා ගැනීම සඳහා සමහර නිෂ්පාදන බදු අනුපාතිකයන් වැඩි කරන ලදී. ඒ අනුව පෙට්‍රල් හා.සේ.බ.න් නිදහස් කිරීම නිසා නැති වන ආදායම පියවීම සඳහා පෙට්‍රල් සඳහා නිෂ්පාදන බදු සියයට 25 සිට සියයට 50 දක්වා වැඩි කරන ලද අතර එලෙසම මත්පැන් සඳහා පනවන ලද නිෂ්පාදන බදු සියයට 12.75 සිට සියයට 20.20 දක්වා වැඩි කරන ලදී. සිගරට් ගැන සැලකීමේදී, හා.සේ.බ. ගණනය කරන බදු පදනමට නිෂ්පාදන බදු අඩංගු කරන ලදී.

ආදායම් බදු ව්‍යුහය තවදුරටත් විධිමත් කිරීම සඳහා 1997 අයවැය මගින් සාමූහික ලාභ බදු සහ පුද්ගලික ආදායම් බදුවල උපරිම අනුපාතිකය 1998 දී සියයට 35 සිට සියයට 30 දක්වා සහ 1999 දී සියයට 25 දක්වාද අඩු කිරීමට ප්‍රකාශ කෙරිණි. එහෙත් රජයේ ආදායමේ ඇති වියහැකි බලපෑම ගැන සලකා මෙම යෝජනාව 1998 දී ක්‍රියාත්මක නොකරන ලදී. ඒ වෙනුවට තෝරා ගත් ප්‍රමුඛතා අංශ සඳහා ආදායම් බදු සහන සලසන ලදී. ඒ අනුව කෘෂිකර්මය, ධීවර, පශු සම්පත් හා සංචාරක යන අංශවල ව්‍යවසායයන් සඳහා සාමූහික බදු අනුපාතය සියයට 15 දක්වා අඩු කරන ලදී. කර්මාන්ත ප්‍රතිස්ථානගත කිරීම, නව ඇඟලුම් කම්හල් ඇරඹීම සහ ප්‍රදේශගත නිශ්චිත ක්‍රියාදාමයන් වැඩි දියුණු කිරීම පිණිස වෙන් කරන ලද ආර්ථික කේන්ද්‍රයන් ඇති කිරීම සඳහා මූල්‍යමය පහසුකම් ලබා දීම තුළින් 1998 දී ප්‍රාදේශීය කාර්මීකරණ වැඩ පිළිවෙල තවදුරටත් ශක්තිමත් කරන ලදී. මීට අමතරව ඉලෙක්ට්‍රෝනික් කර්මාන්ත, පිඟන් මැටි සහ වීදුරු භාණ්ඩ, රබර් පදනම් කරගත් කර්මාන්ත, ලුහු හා බැර ඉංජිනේරු කර්මාන්ත, මැණික් කැපීම හා ඔප දැමීම සහ දියමන්ති හා ස්වර්ණාභරණ නිෂ්පාදන වැනි ප්‍රමුඛ කර්මාන්ත සඳහා ආයෝජන මණ්ඩලය තුළින් සහන ලබා දෙන ලදී.

ප්‍රාග්ධන වෙළෙඳපළ වැඩි දියුණු කිරීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපළේ ලැයිස්තුගත කිරීමට බලාපොරොත්තු වන සහ දනටමත් කොටස් වෙළෙඳපළේ ලැයිස්තුගත සමාගම් සඳහා ප්‍රතිශත අංක 5 ක ආදායම් බදු සහනයක් ලබා දෙන ලදී. මිල නියම නොකල සමාගම්වල කොටස් විකිණීමෙන් ලද ප්‍රාග්ධන ලැබීම් ආදායම් බදු වලින් නිදහස් කල අතර, සමාගම් ලැයිස්තුගත කිරීමේදී දරන වියදම් බදු ගණනය කිරීමේදී අඩුකළ හැකි වියදමක් ලෙස සැලකේ. කොටස් හුවමාරුවේදී ඇති වන අධික පිරිවැය සලකා ප්‍රාථමික කොටස් නිකුතුවේදී දැරීමට සිදු වන මුද්දර ගාස්තු සෑම රුපියල් 1,000 ක් සඳහාම ශත 50 ක් ලෙස අඩු කල අතර, කොටස් සහ විනිමය කොමිසම මගින් පනවන ලද සෙස් බද්ද සියයට 0.15 සිට සියයට 0.1 දක්වා අඩු කරන ලදී. ලැයිස්තුගත සමාගම්වලට ඔවුන්ගේම අර්ථසාධක අරමුදල් පවත්වාගෙන යෑමට අවසර දෙන ලදී. කොටස් වෙළෙඳපළ ක්‍රියාකාරකම්හි පුද්ගලයින්ගේ සහභාගිත්වය දිරි ගැන්වීම සඳහා ලැයිස්තුගත සමාගම් සතු නව කොටස්වල කරනු ලැබූ ආයෝජනයන් තක්සේරු කළහැකි ආදායමෙන් අඩු කිරීමේ හැකියාව නැවත ලබාදෙන ලදී. වෙළෙඳපළ ගණුදෙනු පියවීමේදී ආයෝජකයන්ගේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා ගණුදෙනු පියවීමේ අවදානම් බව අඩු කිරීමට ගණුදෙනු පියවීමේ සහතික අරමුදලක් සහ වන්දි ලබා දීමේ අරමුදලක් 1998 දී පිහිටුවන ලදී.

කුඩා ආයෝජකයින්ගෙන් අරමුදල් රැස් කර ගන්නා ඒකකභාර කොටස් හා ණය සුරැකුම් වෙළඳපොළ සංවර්ධනයට අවශ්‍ය සම්පත් රාශිකරණය කිරීම තුළින් සිදු කෙරෙන කාර්ය භාරය සලකා එම ආයතනවලට ලබා දුන් බදු විරාමයන් තවදුරටත් දීර්ඝ කරන ලදී. පුද්ගලික අංශයේ ණය සුරැකුම් වෙළෙඳපළ දියුණු කිරීම සඳහා පුද්ගලික ආයතන, ණයකර සහ ලියාපදිංචි සමාගම් විසින් නිකුත් කරනු ලැබූ අනෙකුත් ණය සුරැකුම් ආදිය විකිණීම නිසා ලත් ප්‍රාග්ධන ලාභ ආදායම් බදු වලින් නිදහස් කරන ලදී. මූල්‍ය වෙළෙඳපළ ගණුදෙනුවලදී දැරීමට සිදුවන පිරිවැය අඩු කිරීමට සහ රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ දියුණු කිරීම සඳහා ප්‍රති මිලදී ගැනීම්, නාම මාත්‍ර නෝට්ටු, විනිමය බිල්පත්, උකස් සුරැකුම්පත් සහ කල්බදු ගිවිසුම් සඳහා උකස් බැඳුම්කර යනාදිය සඳහා මුද්දර ගාස්තු, සැලකිය යුතු ලෙස අඩු කරන ලදී.

වඩා විධිමත් තීරු බදු ව්‍යුහයක් නිර්දේශ කරනු පිණිස 1997 දී පත් කරන ලද ජනාධිපති තීරු බදු කොමිසම තම අවසන් වාර්තාව 1998 දී ඉදිරිපත් කළේය. පියවර දෙකකින්, අගයන් 2 කින් යුතු තීරු බදු අනුපාත ව්‍යුහයකට මාරු වීම එහි අඩංගු වූ ප්‍රධානතම නිර්දේශය විය. වසර 2,000 දී බදු අනුපාත දෙකකින් යුත් තීරු බදු ව්‍යුහයක් ඇති කිරීමට රජය තීරණය කරන ලදී. ඒ අතර දනට පවත්නා බදු අනුපාත 3 වන සියයට 10, 20 සහ 35 වූ තීරු බදු ව්‍යුහය කෘෂිකාර්මික ද්‍රව්‍ය සඳහා හැර සියයට 5, 10 සහ 30 දක්වා තවදුරටත් අඩු කරන ලදී. ශ්‍රී ලංකාවේ

නිෂ්පාදනය නොකරන ආනයනය කරනු ලබන සියළුම කාර්මික අමු ද්‍රව්‍ය සහ යන්ත්‍ර සියයට 5 ක් වූ තීරු බදු තීරය යටතට පත් කරන ලද අතර, ගමනාගමන, විදුලි සංදේශ සහ වෛද්‍ය උපකරණ බදු රහිතව ආනයනයට ඉඩ දෙන ලදී. කාර් හා ජීප් රථ සඳහා තීරු බදු සියයට 50-100 සිට සියයට 30 දක්වා පහත හෙලූ අතර, මෙම අඩු කිරීම නිසා සිදුවන ආදායම් නැති වීම පියවීම පිණිස සියළුම ආනයනික වාහන සඳහා සියයට 10 ක අතිරේක නිෂ්පාදන බද්දක් පනවන ලදී. දේශීය කෘෂිකර්මාන්තය ආරක්ෂා කිරීම පිණිස කෘෂිකාර්මික නිෂ්පාදන මත තීරු බදු සියයට 35 කම පවත්වාගෙන යන ලද අතර, සමහර ආනයනයන් සියයට 20 ක තීරු බදු අනුපාතයෙහිම තව-දුරටත් තබන ලදී. ඒ අනුව අගයයන් 2 ක තීරු බදු ව්‍යුහය පනවන තෙක් ඇති අතුරු කාලසීමාව තුළ ශ්‍රී ලංකාවෙහි බදු අනුපාත 5 ක තීරු බදු ව්‍යුහයක් පවතී.

දේශීය රෙදිපිළි සහ අනිකුත් ද්‍රව්‍ය මහා පරිමාණ ලෙස නිෂ්පාදනය වැඩි කිරීම, රේගුවේ ඇති වන ප්‍රමාදයන් ඉවත් කිරීම, දූෂණ සහ නීති විරෝධී ආකාරයෙන් බඩු ගෙන්වීම අඩු කිරීම, අපනයන සඳහා කාලසීමාව අඩු කිරීම තුළින් අපනයන කරුවන්ගේ තරඟකාරිත්වය වැඩි කිරීම සහ බහුවිධ කෙඳි ගිවිසුම මඟින් පනවන ලද සීමා ක්‍රමයෙන් ඉවත් කිරීම නිසා නුදුරු අනාගතයේදී ජාත්‍යන්තර වෙළෙඳ පරිසරය තුළ වර්ධනය වන තරඟකාරිත්වයට මුහුණ දීමට රෙදිපිළි නිෂ්පාදකයින් හා අපනයන කරුවන් සැකසීම යන කරුණු අරමුණු කරගෙන රෙදිපිළි ආනයන සම්පූර්ණයෙන්ම නිදහස් කරන ලදී. මෙම ලිහිල්කරණ ක්‍රියාවලිය යටතේ ආනයනික නූල් රෙදිපිළි සහ ඊට අනුබද්ධිත සියළුම අතරමැදි සහ ප්‍රාග්ධන භාණ්ඩ තීරු බදු වලින් නිදහස් කරන ලද අතර, නිර්යාත නොකරන දේශීය ඇඟළුම් කර්මාන්ත ආරක්ෂා කිරීම පිණිස මසා නිම කරන ලද ඇඳුම් සඳහා වූ ආනයන තීරු බදු සියයට 10 ක අගයක තබා ගැණිනි. රෙදිපිළි කර්මාන්තය නවීකරණය කිරීම සහ නව තාක්ෂණය ලබා ගැනීම පිණිස වාණිජ බැංකු හා සංවර්ධන බැංකු තුළින් ක්‍රියාත්මක වන රෙදිපිළි කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලක් රජය මඟින් සැලසුම් කරන ලදී. මෙම ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ රෙදිපිළි ණය ආපසු ලබා ගැනීමේ අරමුදලක් රජය මඟින් පිහිටුවා ඇත.

අඩු ආදායම් සහ විවිධ පීඩාවනට ලක් වූ ජනතාවගේ මූලික අවශ්‍යතා වන ආහාර, නිවාස හා සෞඛ්‍යය, පහසුකම් ලබා දීම 1998 වසර තුළද රජය තම සුභසාධන ව්‍යාපෘතීන් මඟින් සිදු කරන ලදී. දිළිඳු බව පිටු දැකීමේ ප්‍රධානතම ව්‍යාපෘතිය වන සමෘද්ධි ව්‍යාපාරය මඟින් පවුල් දශ ලක්ෂ 2 කට ආසන්න ප්‍රමාණයක් ආවරණය කෙරේ. සමෘද්ධි-ලාභීන්ගේ ස්වයං රැකියා අවස්ථාවන් වැඩි කිරීම පිණිස ණය ලබා දීමේ යෝජනා ක්‍රම ගණනාවක් සහ කල් බදු ක්‍රමයයක් දියත් කිරීම තුළින් මෙම සමෘද්ධි ව්‍යාපාරයේ කටයුතු විවිධාංගීකරණය කරන ලදී. අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද වැඩි කිරීම පෙරදැරි කරගෙන සමෘද්ධි බැංකු (ඉතුරුම් සහ ණය දීමේ සමිති වැනි) පිහිටුවීම තවදුරටත් සිදු වුණි. ධීවරයන්, වැවිලි ක්ෂේත්‍රයේ කම්කරුවන් සහ නාගරික ප්‍රදේශවල අඩු වරප්‍රසාද ලත් පදිංචිකරුවන් වැනි ජන කොටස් ඉලක්කගත කර ගත් නිවාස වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතීන් ඇරඹිණි. ආයෝජන මණ්ඩල විධිවිධාන හා අනුරූපව පදනම් දෙකක් යටතේ පෞද්ගලික රෝහල් ස්ථාපනය කිරීම පිළිබඳව නව සංකල්පයක් හඳුන්වා දුන් අතර එමඟින් නොමිලේ සැපයෙන පොදු සෞඛ්‍ය සේවාවන්හි, පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිගන්වනු ලැබිණ. මේ අනුව අඩු ආදායම් ලබන අයට බාහිර මෙන්ම නේවාසික රෝගී අංශ ඇතුළත් සෞඛ්‍යමය සේවාවන් නොමිළයේ ලබාදීමට මෙන්ම ගාස්තු අයකරන සෞඛ්‍ය සේවාවන් පවත්වා ගැනීමටත් යෝජිතය.

වැටුප්, විශ්‍රාම වැටුප් හා කුටුම්භයන්ට කරනු ලබන පැවරුම් හැර අනිකුත් වර්තන වියදම් වලින් සියයට 10 ක කපා හැරීමක් බලපැවැත්වීම තුළින් අයවැය ක්‍රියාවලියේ වියදම් පාලනය කිරීමේ කටයුතු තවදුරටත් කරන ලදී. සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යාංශ හැර අනිකුත් සියළුම රාජ්‍ය ආයතනවලට මෙම වියදම් කපා හැරීම බලපවත්වනු ලැබිණ. මූල්‍යමය විනයක් ඇති කිරීම පිණිස රාජ්‍ය ආයතනවලට ණය ගැනීමේ විශේෂිත සීමාවන් පනවන ලදී. මෙම ක්‍රියාමාර්ග මධ්‍යයේ වුවද, විශේෂයෙන්ම ශ්‍රී ලංකා දුම්රිය හා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වැනි සමහර රාජ්‍ය ආයතන හා සංස්ථාවන්ට 1998 වසර තුළ කරන ලද පැවරුම් තවදුරටත් වැඩි විය. රජයේ අයවැය මත පොලී මඟින් ඇති වන බලපෑම අඩු කිරීමේ අරමුණින් රුපියල් ණය කලින් පියවීමේ විකල්පය උපයෝගී කර ගැනීමද 1998 දී සිදු විය. මේ අනුව සියයට 15-16 අතර වාර්ෂික පොලී අනුපාත සහිත රුපියල් ණය රුපියල් දශ ලක්ෂ 16,000 ක් කලින් ගෙවා දැමිණ. අඩු පොලී අනුපාතික යටතේ නව රුපියල් ණය නිකුත් කෙරුණ අතර එම රුපියල් ණය සඳහා ද ගෙවීමේ විකල්පය ඇතුළත් කෙරීන.

රජයේ ණය වැඩසටහන වඩා වෙළඳපළ මත නැඹුරු කිරීමේ උත්සාහයන්හි ප්‍රගතියක් දක්නට ලැබිණ. රජයේ අයවැය හිඟය මූල්‍යණය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් විශාල කොටසක් භාණ්ඩාගාර බැඳුම්කර මඟින් කෙරිණි. ශුද්ධ දේශීය ණය ගැනීම්වල කොටසක් ලෙස 1997 දී සියයට 33 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර 1998 දී සියයට 59 දක්වා ඉහළ යෑම තුළින් මෙම තත්ත්වය පිළිබිඹු වේ.


භාණ්ඩාගාර බැඳුම්කරවල වෙළෙඳපොළ නැම්යාව දියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ගනු ලැබිණ. සේවක අර්ථසාධක අරමුදල, භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවලට සෘජුව සහභාගී වීම 1998 දී නවත්වන ලදී. මේ නිසා වෙළඳපොළ මූලධර්මවලට අනුකූල නොවූ තරඟකාරී නොවන පොලී අනුපාතිකයන් රහිත ලංසු ඉදිරිපත් කිරීම නැවතිණි. භාණ්ඩාගාර බැඳුම්කරවල කල් පිරෙන කාලසීමාව අවුරුදු 2 සිට අවුරුදු 4 දක්වා වැඩි කරන ලද අතර 1999 දී වසර 6 දක්වා තවදුරටත් වැඩි කිරීමට බලාපොරොත්තු වේ. ආයෝජකයන්ට තම ආයෝජන කළමනාකරණය වඩා නම්‍යශීලී භාවයකින් පවත්වා ගැනීමේ අරමුණින් භාණ්ඩාගාර බැඳුම්කර විශාල නිකුතු (එක් කල් පිරෙන දිනයක් සහිත සහ විශාල අගයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර, විවිධ කාලසීමාවන් සහිත කුඩා වටිනාකම් වලින් යුතුව අලෙවි

කරනු ලැබිණ) හඳුන්වා දෙන ලදී. භාණ්ඩාගාර බැඳුම්කර තම ද්‍රවශීලී වත්කම්වල කොටසක් ලෙස සැලකීමට වාණිජ බැංකුවලට අවසර දෙන ලදී. ඒ අතරම වැඩිමනත් අරමුදල් ආයෝජනය කිරීම සහ තාවකාලික ද්‍රවශීලතාවය ලබා ගැනීමත් සඳහා වාණිජ බැංකුවලට සහ ප්‍රාථමික වෙළෙඳුන්ට මහ බැංකුවේ ද්විතීයක කවුළුව තුළින් භාණ්ඩාගාර බැඳුම්කර ගණුදෙනු කිරීමට අවසර දෙන ලදී.

## 8.2 අයවැය තත්ත්වය

මීට ඉහතදී සඳහන් කළ පරිදි, සමස්ත අයවැය හිඟය හා සලකා බලන කල 1998 දී රාජ්‍ය මූල්‍ය කටයුතුවල කැපී පෙනෙන පසුබෑමක් වාර්තා විය. බදු ආදායමේ මන්දගාමී වර්ධනය සමඟ විශේෂයෙන්ම අධික ආරක්ෂක වියදම් ඇතුළුව රාජ්‍ය වියදම් විශාල ලෙස වැඩි වීම හේතුකොටගෙන පසුගිය වර්ෂ තුන තුළදී දක්නට ලැබුණු රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය අඩාල විය. ආරක්ෂක වියදම් 1997 පැවති රුපියල් දශ ලක්ෂ 47,718 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 56,396 දක්වා වැඩි වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස 1997 පැවති සියයට 5.4 සිට 1998 දී සියයට 5.6 දක්වා වැඩි විය. වර්තන ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස 1997 පැවති සියයට 2.2 සිට 1998 දී සියයට 2.4 දක්වා වැඩි විය. මේ අතර ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණයදීම්වල සිදු වූ ප්‍රතිශතාංක 1.1 ක වැඩි වීමද සමස්ත අයවැය හිඟය වැඩි වීමට හේතු විය. මේ අනුව සමස්ත අයවැය හිඟය (ප්‍රදානයන්ට සහ පුද්ගලීකරණ ලැබීම්වලට පෙර) 1997 පැවති දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස සියයට 7.9 සිට 1998 දී සියයට 9.2 දක්වා වැඩි වූ අතර, 1998 අයවැය මගින් බලාපොරොත්තු වූයේ සියයට 6.5 ක අයවැය හිඟයකි. ප්‍රාථමික අයවැය හිඟය එනම් පොලී වියදම් රහිත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1997 දී සියයට 1.7 සිට 1998 දී සියයට 3.8 දක්වා වැඩි විය.

**8.1 රූප සටහන**
**රාජ්‍ය මූල්‍ය දර්ශක**




රජයේ මුළු ආදායම, 1995 සිට දක්නට ලැබුණු උපනතිය හා අනුව යමින් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1997 පැවති සියයට 18.5 සිට 1998 දී තවදුරටත් සියයට 17.3 දක්වා අඩු විය. 1998 ආදායම් ඉලක්කය වූයේ සියයට 18.4 කි. මුළු ආදායමේ මෙම පහත වැටීමට සම්පූර්ණයෙන්ම හේතු වූයේ බදු ආදායමේ කැපී පෙනෙන අඩු වීම වන අතර, එය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1997 පැවති සියයට 16 සිට 1998 දී සියයට 14.5 දක්වා අඩු විය. භාණ්ඩ සහ සේවා බද්ද ප්‍රමාණවත් ලෙස ආදායම් රැස් කිරීමට අසමත් වූ අතර එම අඩු වීමට ආදායම් මධ්‍යස්ථව පවත්වාගෙන යා හැකි මට්ටමට වඩා අඩු බදු අනුපාතයක් නියම කිරීම, නව බද්ද සංක්‍රමන අවස්ථාවේ පැවතීම සහ විශාල භාණ්ඩ සංඛ්‍යාවක් බදු ව්‍යුහයෙන් ඉවත් කිරීම යන කරුණු හේතු විය. ආදායම් බදු යටතේ විවිධ බදු ඉවත් කිරීම් සහ සහනයන් ලබා දීම නිසා ආදායම් බදු පදනම අඩු වීමට හේතු විය. ආනයන බදු ආදායම අඩු වූ අතර, ඊට බදු ඉවත් කිරීම සහ සහන ලබා දීම සහ ශ්‍රී ලංකාව ආනයනය කරන ප්‍රධාන ආනයන භාණ්ඩවල මිල කැපී පෙනෙන ලෙස අඩු වීම නිසා මුළු ආනයනවල වටිනාකම අඩු වීම යන කරුණු හේතු විය. බදු නොවන ආදායම සියයට 23 ක විශාල වැඩි වීමක් වාර්තා කරන ලද අතර, එයට රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් ලැබුණු අමතර ලාභ, වැවිලි සමාගම් වලින් ලැබූ බදු කුලී වැඩි වීම සහ පොලී, අයකිරීම් ලාභාංශ යනාදී අනෙකුත් බදු නොවන ආදායම් වේලාවට රැස් කර ගැනීම දක්විය හැක.

පොලී වියදම් සහ සහනාධාර අඩු වීම නිසා වර්තන වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රතිශතාංක 1.1 කින් අඩු විය. පොලී ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.2 සිට 5.4 දක්වා 1998 දී අඩු වූ අතර එමගින් පසුගිය වර්ෂ දෙක තුළ රාජ්‍ය මූල්‍ය කටයුතුවල සිදු වූ යහපත් වර්ධනය නිසා පොලී වියදමෙහි වූ පහත වැටීම පිළිබිඹු කරයි. කුටුම්භයනට කරනු ලැබූ පැවරුම් වර්ධනය වීම පාලනය කර ගැනීමට 1998 දී හැකි වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ප්‍රතිශතාංක 0.6 කින් අඩු වී සියයට 3.7 ක් විය. කෙසේ වුවද, වැටුප් වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1997 පැවති සියයට 5.0 සිට 1998 දී සියයට 5.3 දක්වා වැඩි විය. මෙම මුළු වැටුප් වියදමට ආරක්ෂක අංශයේ සේවා නියුක්තිකයින් හා අනෙකුත් රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින් අයත් වේ. මේ සඳහා රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ වැඩි වීම සහ වර්ෂය තුළ කරනු ලැබූ වැටුප් වැඩි වීම හේතු විය.

1998 දී රාජ්‍ය ආයෝජනය (දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස සියයට 6.7) 1998 අයවැය මගින් ඉලක්කකරණ ලද සියයට 6.9 ට ආසන්න විය. මෙය පසුගිය වර්ෂ දෙක තුළදී සිදු වූ අඩු වීම සමඟ සැසඳූවිට කැපී පෙනෙන වර්ධනයක් වන අතර, පසුගිය වර්ෂ දෙක තුළදී රාජ්‍ය ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස සියයට 5.9 ක සාමාන්‍ය අගයක පැවතුණි. ආරක්ෂක වියදම් ඉහළ මට්ටමක පැවතෙමින් වුවද රාජ්‍ය

## 8.1 සංඛ්‍යා සටහන
## රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය (අ)

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998 අනුමත ඇස්තමේන්තු | 1998 තාවකාලික | 1999 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම | 110,038 | 136,258 | 146,279 | 165,036 | 188,437 | 175,032 | 214,320 |
| බදු ආදායම | 99,417 | 118,543 | 130,202 | 142,512 | 164,048 | 147,368 | 185,410 |
| බදු නොවන ආදායම | 10,621 | 17,715 | 16,077 | 22,524 | 24,389 | 27,664 | 28,910 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළපසු ණයදීම් | 170,764 | 203,483 | 218,659 | 235,096 | 255,085 | 268,179 | 283,263 |
| වර්තන | 127,084 | 154,159 | 175,148 | 184,749 | 187,090 | 199,648 | 199,205 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණයදීම් | 43,680 | 49,324 | 43,511 | 50,347 | 67,995 | 68,531 | 84,058 |
| රාජ්‍ය ආයෝජන | 40,455 | 52,809 | 45,973 | 51,260 | 70,997 | 68,278 | 84,556 |
| වෙනත් ප්‍රාග්ධන | 3,225 | -3,486 | -2,463 | -913 | -3,002 | 253 | -498 |
| වර්තන ගිණුමේ අතිරික්තය (+)/ හිඟය (-) | -17,046 | -17,901 | -28,869 | -19,714 | 1,347 | -24,616 | 15,115 |
| ප්‍රාථමික ගිණුමේ අතිරික්තය (+)/ හිඟය (-) | -22,695 | -29,000 | -23,457 | -14,815 | -11,282 | -38,250 | -9,163 |
| සමස්ත අයවැය හිඟය (ප්‍රදානයන්ට පෙර) | -60,726 | -67,225 | -72,380 | -70,061 | -66,648 | -93,147 | -68,943 |
| පියවීම | 60,726 | 67,225 | 72,380 | 70,061 | 66,648 | 93,147 | 68,943 |
| විදේශීය ණය ගැනීම් | 20,035 | 30,252 | 17,898 | 17,287 | 25,426 | 17,396 | 20,283 |
| ශුද්ධ ණය ගැනීම් | 11,778 | 21,224 | 10,160 | 9,958 | 16,426 | 10,196 | 12,283 |
| ප්‍රදානයන් | 8,257 | 9,028 | 7,739 | 7,329 | 9,000 | 7,200 | 8,000 |
| දේශීය ණය ගැනීම් | 37,696 | 33,972 | 49,754 | 30,275 | 33,221 | 71,362 | 40,660 |
| වෙළෙඳපොළ | 38,362 | 33,424 | 39,391 | 39,644 | 33,221 | 72,292 | 40,660 |
| බැංකු නොවන | 37,205 | 26,359 | 26,301 | 41,816 | 33,221 | 53,338 | 40,660 |
| බැංකු | 1,157 | 7,065 | 13,090 | -2,171 | - | 18,954 | - |
| මූල්‍ය අධිකාරිය | 1,764 | 7,662 | 9,873 | -13,991 | - | 5,609 | - |
| වාණිජ බැංකු | -607 | -597 | 3,218 | 11,820 | - | 13,345 | - |
| අනෙකුත් ණය ගැනීම් | -666 | 548 | 10,363 | -9,369 | - | -930 | - |
| පෞද්ගලීකරණ ලැබීම් | 2,996 | 3,001 | 4,728 | 22,499 | 8,000 | 4,389 | 8,000 |
| | දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | |
| මුළු ආදායම | 19.0 | 20.4 | 19.0 | 18.5 | 18.4 | 17.3 | 18.5 |
| බදු ආදායම | 17.2 | 17.8 | 17.0 | 16.0 | 16.0 | 14.5 | 16.0 |
| බදු නොවන ආදායම | 1.8 | 2.7 | 2.1 | 2.5 | 2.4 | 2.7 | 2.5 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළපසු ණයදීම් | 29.5 | 30.5 | 28.5 | 26.4 | 24.9 | 26.4 | 24.5 |
| වර්තන | 21.9 | 23.1 | 22.8 | 20.8 | 18.3 | 19.7 | 17.2 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණයදීම් | 7.5 | 7.4 | 5.7 | 5.7 | 6.6 | 6.8 | 7.3 |
| රාජ්‍ය ආයෝජන | 7.0 | 7.9 | 6.0 | 5.8 | 6.9 | 6.7 | 7.3 |
| වෙනත් ප්‍රාග්ධන | 0.6 | -0.5 | -0.3 | -0.1 | -0.3 | - | - |
| වර්තන ගිණුමේ අතිරික්තය (+) / හිඟය (-) | -2.9 | -2.7 | -3.8 | -2.2 | 0.1 | -2.4 | 1.3 |
| ප්‍රාථමික ගිණුමේ අතිරික්තය (+) / හිඟය (-) | -3.9 | -4.3 | -3.1 | -1.7 | -1.1 | -3.8 | -0.8 |
| සමස්ත අයවැය හිඟය (ප්‍රදානයන්ට පෙර) | -10.5 | -10.1 | -9.4 | -7.9 | -6.5 | -9.2 | -6.0 |
| හිඟය පියවීම | 10.5 | 10.1 | 9.4 | 7.9 | 6.5 | 9.2 | 6.0 |
| විදේශීය ණය ගැනීම් | 3.5 | 4.5 | 2.3 | 1.9 | 2.5 | 1.7 | 1.8 |
| ශුද්ධ ණය ගැනීම් | 2.0 | 3.2 | 1.3 | 1.1 | 1.6 | 1.0 | 1.1 |
| ප්‍රදානයන් | 1.4 | 1.4 | 1.0 | 0.8 | 0.9 | 0.7 | 0.7 |
| දේශීය ණය ගැනීම් | 6.5 | 5.1 | 6.5 | 3.4 | 3.2 | 7.0 | 3.5 |
| වෙළෙඳපොළ | 6.6 | 5.0 | 5.1 | 4.5 | 3.2 | 7.1 | 3.5 |
| බැංකු නොවන | 6.4 | 3.9 | 3.4 | 4.7 | 3.2 | 5.3 | 3.5 |
| බැංකු | 0.2 | 1.1 | 1.7 | -0.2 | - | 1.9 | - |
| මූල්‍ය අධිකාරිය | 0.3 | 1.1 | 1.3 | -1.6 | - | 0.6 | - |
| වාණිජ බැංකු | -0.1 | -0.1 | 0.4 | 1.3 | - | 1.3 | - |
| අනෙකුත් ණය ගැනීම් | -0.1 | 0.1 | 1.3 | -1.1 | - | -0.1 | - |
| පෞද්ගලීකරණ ලැබීම් | 0.5 | 0.4 | 0.6 | 2.5 | 0.8 | 0.4 | 0.7 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සංඛ්‍යා සටහනේ ඉදිරිපත් කිරීම 1996 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යානවල (GFS) මගපෙන්වීම මත වෙනස් කරන ලදි. ඒ අනුව පුද්ගලීකරණ ලැබීම් ප්‍රාග්ධන සහ ශුද්ධ ණයදීම් වල සිට මූල්‍යනය යටතට මාරු කරන ලදි.

ආයෝජන ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වූයේ 1998 තුළදී විදේශ ආධාර උපයෝජනය ඉහළ මට්ටමක පැවතීමයි. දළ විදේශ ආධාර ලැබීම් 1998 දී රුපියල් දශ ලක්ෂ 6,590 කින් වැඩි වූ අතර විදේශ ආධාර උපයෝජනය කිරීමේ අනුපාතිකය සියයට 79 සිට සියයට 82 දක්වා වැඩි විය. මෑත කාලයේදී රාජ්‍ය ආයෝජනයන් මන්දගාමී වීමට එක් ප්‍රධාන හේතුවක් වූයේ සම්පත් හිඟකමයි. කෙසේ වුවද, පෙර වසරවලදී මෙන් නොව රජය විසින් ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ඇපකැපවීම නිසා ඒ සඳහා දේශීයව අවශ්‍ය මුදල් ලබා දීම සිදුකෙරේ. මේ අනුව රාජ්‍ය ආයෝජන සඳහා දේශීය සම්පත් ලබා දීම 1998 දී සියයට 41 කින් වැඩි වූ අතර 1997 දී එම වැඩි වීම සියයට 11 කි. ප්‍රාග්ධන වියදම් ප්‍රධාන ලෙස බලශක්ති, ප්‍රවාහන, විදුලි සංදේශ, වරාය සහ ජල සම්පාදන හා ප්‍රවාහන යන අංශවල සිදු වූ අතර එම ක්ෂේත්‍රයන්හි ආයෝජන සියයට 41 කින් තියුණු ලෙස වැඩිවී මුළු රාජ්‍ය ආයෝජනයෙන් සියයට 62 ක් නියෝජනය කරන ලදී. ලෝක වෙළෙඳපොළ අවපාත තත්ත්වය යටතේ පෞද්ගලික ආයෝජන මන්දගාමී වී ඇති බැවින් රාජ්‍ය ආයෝජන වැඩි වීම විශේෂයෙන්ම වැදගත් වේ.

රජයේ මුළු ශුද්ධ ණය ගැනීමේ අවශ්‍යතාවය එනම් විදේශ ප්‍රදානයන් හා පුද්ගලීකරණ ආදායම් වලින් පසුව සමස්ත අයවැය හිඟය 1998 දී දෙගුණයකටත් වඩා වැඩි වී රුපියල් දශ ලක්ෂ 81,558 හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස සියයට 8 ක් විය. අයවැය හිඟය පියවීම සඳහා ලැබූ විදේශ සම්පත් ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස සියයට 1 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. මේ අනුව දේශීය අංශයෙන් ණය ගැනීමේ අවශ්‍යතාවය 1997 පැවැති දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.4 සිට 1998 දී 7.0 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. දේශීය සම්පත් සඳහා රජයේ ඉල්ලුම වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකු අංශයෙන් ණය ගැනීම තියුණු ලෙස වැඩි විය. සාමාන්‍යයෙන් බැංකු අංශයෙන් මෙවැනි විශාල ලෙස ණය ගැනීම් පොලී අනුපාතිකයන් කෙරෙහි විශාල පීඩනයන් ඇති කරයි. කෙසේ වුවද, පුද්ගලික අංශයේ ණයගැනීම් මන්දගාමී වූ නිසා මුදල් සැපයුමේ මධ්‍යස්ත ප්‍රසාරණයක් මගින් පොලී අනුපාතිකයෙහි කැපී පෙනෙන වැඩි වීම වලක්වා ගැනීමට හැකි විය.

## 8.3 ආදායම සහ ප්‍රදානයන්


රජයේ ආදායම 1997 වර්ෂයේ සියයට 13 ක වර්ධනය හා සැසඳීමේදී 1998 වර්ෂයේදී සියයට 6 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 175,032 ක් විය. ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1995 දී සියයට 20.4 උපරිමයක සිට 1997 සියයට 18.5 ක් දක්වා පහත වැටුණු අතර එය තවදුරටත් ක්‍රමයෙන් අඩු වෙමින් 1998 දී සියයට 17.3 ක් විය. මෙම අඩු වීම මුළුමනින්ම පාහේ බදු ආදායම දළ ජාතික ආදායමේ වර්ධනයට අනුරූපව වර්ධනය නොවීම නිසා සිදු විය. ප්‍රධාන වශයෙන් ආදායම් පදනමේ පිරිහීම පිළිබිඹු කරමින්, බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1998 දී සියයට 14.5 දක්වා තවදුරටත් පහත වැටුණි. මීට අනුරූපව, බදු නොවන ආදායම 1996 දී දළ දේශීය නිෂ්පාදිතයෙහි සියයට 2.1 සිට 1998 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.7 දක්වා ඉහළ ගියේය. රජයේ ආදායමේ දැකිය හැකි මෙම උපනතීන් බදු පදනම වැඩි දියුණු කිරීමේ සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව පැහැදිලිව පෙන්නුම් කරයි. අයවැය කටයුතු සඳහා විදේශ ප්‍රදානයන් උපයෝජනය කර ගැනීම, 1997 වසරේ රුපියල් දශ ලක්ෂ 7,329 හා සසඳනවිට රුපියල් දශ ලක්ෂ 7,200 ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබිණි.

### බදු ආදායම

බදු ආදායම 1997 දී සියයට 9 ක වැඩි වීම හා සසඳනවිට 1998 දී සියයට 3 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 147,368 ක් විය. බදු ආදායම මුළු ආදායමේ කොටසක් ලෙස ගත් විට පසුගිය වර්ෂ කිහිපය තුළ නොකඩවා අඩු වූ අතර එය 1996 දී සියයට 89 සහ 1997 දී සියයට 86 සිට 1998 දී සියයට 84 දක්වා අඩු විය. එලෙසම, බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1995 දී සියයට 17.8 සහ 1997 දී සියයට 16 සිට 1998 දී සියයට 14.5 දක්වා අඩු විය. බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත්විට 1950 වර්ෂයේ සිට වාර්තා වුනු පහළම අගය මෙය විය. ආයෝජන වැඩි කිරීමත්, ප්‍රාග්ධන වෙළෙඳපළ වැඩි දියුණු කිරීම අරමුණු කොට පසුගිය වර්ෂ කිහිපය තුළ ලබා දුන් නොයෙකුත් බදු නිදහස් කිරීම් සහ බදු සහන සහ පිරිවැටුම් බදු ව්‍යුහය භාණ්ඩ හා සේවා බද්ද (භා.සේ.බ.) බවට පරිවර්තනය කිරීමේදී මධ්‍යස්ථ ආදායමක් ලැබීමේ බදු අනුපාතිකයට වඩා අඩු අනුපාතිකයක් පැනවීම 1998 දී බදු ආදායම අඩු වීමට ප්‍රධාන වශයෙන් බලපාන ලදී. ආර්ථික වර්ධනයේ අඩු වීමද රජයේ ආදායම අඩු වීමට හේතු විය.

1998 අප්‍රියෙල් 1 වන දින සිට හඳුන්වා දුන් භාණ්ඩ හා සේවා බද්ද බදු ව්‍යුහය යථාර්ථවත් කිරීමේ අරමුණින් මෙම වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රධාන පියවරකි. භාණ්ඩ හා සේවා නිෂ්පාදන හා බෙද හැරීමේ ක්‍රියාවලියෙහි සෑම පියවරකම ඇති එකතු කළ අගයයන්ට අය වන පරිදි සියයට 12.5 ක සම්මත බදු අනුපාතයක් මෙම නව පාරිභෝගික බද්ද යටතේ පනවන ලදී. පෙර පැවැති පිරිවැටුම් බදු ක්‍රමය වෙනුවට නව භා.සේ.බ. ආදේශනය කළද නිෂ්පාදන නොවන අංශයට අයත් මූල්‍ය සේවා සඳහා පිරිවැටුම් බදු ක්‍රමය තවදුරටත් පැවතිණි. භා.සේ.බ. ක්‍රියාත්මක කරනවිට ආදායම අඩුනොවී පවත්වා ගැනීමේ අරමුණින් නිෂ්පාදන බදුවල සංශෝධනයන් කරන ලදී. එහෙත් භා.සේ.බ. මගින් එකතු කර ගත් ආදායමේ සැලකිය යුතු අඩු වීම (වසරේ අපේක්ෂිත ආදායම හා සසඳනවිට රුපියල් දශ ලක්ෂ 7,787 ක අඩු වීමක්) 1998 වර්ෂයේ දී මෙම බද්දෙහි දුර්වල ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරයි. 1997 පිරිවැටුම් බදුවල ආදායම සියයට 16 ක වැඩි වීම හා සසඳනවිට 1998 දී පිරිවැටුම් බදු සහ භා.සේ.බ. මගින් එකතු කර ගත් මුළු ආදායම සියයට 9 කින් පහත වැටී රුපියල් දශ ලක්ෂ 39,343 ක් විය.

**8.2 රූප සටහන**
**ආදායම් සංයුතිය**




නිෂ්පාදන අංශයේ පිරිවැටුම් බදු හා හා.සේ.බ. යන දෙකෙහි ඒකාබද්ධ ආදායම 1998 දී සියයට 4 න් පහත වැටුණි. ඛනිජ තෙල් නිෂ්පාදන, හා.සේ.බ.න් නිදහස් වීම සහ සියයට 18 ක්ව පැවති නිෂ්පාදන බදු අනුපාතය සියයට 12.5 දක්වා අඩු වීම නිසා ඇති වන ආදායමේ පහත වැටීම පියවීම පිණිස නිෂ්පාදන බදු අය කරන නිෂ්පාදනයන් සඳහා කරන ලද සමස්ත බදු සංශෝධනයන් නිසා 1998 දී රුපියල් දශ ලක්ෂ 800 ක පමණ ආදායමක් හා.සේ.බ. සිට නිෂ්පාදන බදුවලට මාරු වීම සිදු විය. මීට අමතරව නිෂ්පාදන අංශයේ සේවා යෙදවුම් සඳහා ලබා දෙන ලද යෙදවුම් බදු ණය පහසුකම්ද මෙම අඩු වීමට දායක විය. මේ අතර, නිෂ්පාදන නොවන සේවාවන් මත පිරිවැටුම් බදු/හා.සේ.බ. ආදායම 1998 දී සියයට 5 ක පහත වැටීමක් සිදු වූ නමුත් 1997 දී පිරිවැටුම් බදු ආදායමෙහි සියයට 37 ක ඉහළ වර්ධනක් දක්නට ලැබුණි. නැව් සේවා, ගුවන් සේවා සහ වරාය අධිකාරිය හා ගුවන් තොටුපළ හා ගුවන් සේවා කටයුතුවල ප්‍රධාන සේවාවන් භාණ්ඩ හා සේවා බද්දෙන් නිදහස් කිරීම සහ හා.සේ.බ. යටතේ වන යෙදවුම් බදු ණය පහසුකම් අඑතින් හඳුන්වා දීම ද මෙම ආදායම් ශීර්ෂයේ පහත වැටීමට බලපෑ ප්‍රධාන හේතූන් ලෙස පෙන්වා දිය හැක. මීට අමතරව මූල්‍යමය කටයුතු සඳහා අය කරන ලද පිරිවැටුම් බද්ද 1997 පැවති සියයට 2 සිට 1998 දී සියයට 1 දක්වා අඩු වීමේ සම්පූර්ණ බලපෑමද 1998 වර්ෂයේදී නිෂ්පාදන නොවන අංශයෙන් එකතු කර ගත් ආදායම අඩු වීමට හේතු විය. ආනයන මත හා.සේ.බ./පිරිවැටුම් බද්ද මගින් ලැබුණු ආදායම රුපියල් දශ ලක්ෂ 25,358 වූ අතර, ආනයන යෙදවුම් මත ආපසු බදු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 7,826 ක් විය. ඒ අනුව ආනයන මත පිරිවැටුම් බදුවල 1997 දී සියයට 9 ක වැඩි වීම හා සසඳනවිට 1998 දී ආනයන මත හා.සේ.බ./පිරිවැටුම් බද්ද මගින් එකතු කර ගත් ශුද්ධ ආදායම රුපියල් දශ ලක්ෂ 17,532 ක් වූ අතර එය සියයට 15 ක අඩු වීමකි. ආනයන බදු පදනම ගණනය කිරීමේදී ආනයන වටිනාකමට එකතු කරන සියයට 10 (1997 නොවැම්බර්වලට පෙර මෙය සියයට 25 ක් විය) හා.සේ.බ. යටතේ ඉවත් කිරීම සහ හා.සේ.බ. යටතේ නිදහස් කරන ලද භාණ්ඩ ප්‍රමාණය ඉහළ යෑම හා.සේ.බ. සඵල බදු පදනම පහත වැටීමට හේතු විය. බදු ආපසු ගෙවීම් ක්‍රමයේ ඇති විය හැකි අයථා කටයුතු සහ අපනයනකරුවන්ගේ ඉල්ලීම මත බදු ගෙවීම් කළයුතු කාලය දින 45 සිට දින 60 දක්වා ඉහළ දැමීමද 1998 මෙම ප්‍රභවයෙහි ආදායම අඩු වීමට දායක වුවා විය හැක. එමනිසා බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ ක්‍රමවත් හා විධිමත් අධීක්ෂණය සහ විගණන කටයුතු ඇති කිරීම මගින් හා.සේ.බ. ආදායම වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.

නිෂ්පාදන බදු 1997 දී පැවති සියයට 12 ක වර්ධනය හා සසඳනවිට 1998 දී සියයට 22 කින් වර්ධනය වී රුපියල් දශ ලක්ෂ 30,293 ක් විය. නිෂ්පාදන බදු මුළු බදු ආදායමේ කොටසක් ලෙස ගත්විට 1997 සියයට 17.4 සිට 1998 දී සියයට 20.5 දක්වා වැඩි විය. එහෙත් සිගරට් මත නිෂ්පාදන බදු1997 දී සියයට 10 ක වර්ධනය හා සසඳනවිට 1998 දී සියයට 6 ක අඩු වර්ධනයක් වාර්තා කරන ලදී. මෙය ප්‍රධාන හේතු දෙකක් නිසා සිදු විය. ප්‍රථමයෙන් හා.සේ.බ. ක්‍රියාත්මක කිරීමත් සමඟ ආදායම සහ මිල නොවෙනස්ව පවත්වා ගැනීම සඳහා සිගරට් මත නිෂ්පාදන බදු අඩු කරන ලදී. ඒ අනුව රුපියල් දශ ලක්ෂ 1,100 බදු ආදායමක් නිෂ්පාදන බදුවල සිට හා.සේ.බ. මාරු විය. දෙවනුව, 1998 ජූලි සහ නොවැම්බර් මාසවලදී කරන ලද සිගරට් මිල ඉහළ දැමීම් (සමස්ත මිල වැඩි වීම සියයට 22-25 ක් විය) සිගරට් අලෙවියෙහි වර්ධනයට අයහපත් ලෙස බලපෑවේය. 1998 වර්ෂයේ පළමු භාගයේ සියයට 5 කින් වර්ධනය වූ සිගරට් අලෙවිය දෙවන භාගයේදී සියයට 1 දක්වා පහත වැටුණි. මීට ප්‍රතිවිරුද්ධ ලෙස, මත්පැන් වලින් එකතු කරගත් සුරා බදු ආදායම 1997 දී පැවති සියයට 6 ක වැඩි වීම හා සැසඳීමේදී 1998 දී සියයට 24 ක වැඩි වීමක් පෙන්නුම් කෙරිණි. මෙය 1998 අප්‍රියෙල් මසදී නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත යටතේ පැවති නිෂ්පාදන බදු සියයට 12.75 සිට සියයට 20.2 දක්වා

## 8.2 සංඛ්‍යා සටහන

## රාජ්‍ය ආදායම් සංයුතියෙහි සම්පිණ්ඩනය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998 අනුමත ඇස්තමේන්තු | 1998 තාවකාලික | 1999 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **99,417** | **118,543** | **130,202** | **142,512** | **164,048** | **147,368** | **185,410** |
| ආදායම් බදු | 15,277 | 17,161 | 20,751 | 21,548 | 24,064 | 20,429 | 24,192 |
| පෞද්ගලික | 5,621 | 7,358 | 7,315 | 8,183 | 8,639 | 8,099 | 9,934 |
| සාමූහික | 9,656 | 9,803 | 13,311 | 13,038 | 14,850 | 11,788 | 13,544 |
| ජාතිය රැකගැනීමේ අරමුදල | - | - | 125 | 327 | 575 | 542 | 714 |
| දේපල මත බදු | 4,386 | 5,162 | 5,279 | 6,392 | 8,056 | 7,079 | 9,293 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් මත බදු | 471 | 1,050 | 1,604 | 1,080 | - | - | - |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 56,685 | 70,797 | 77,105 | 86,750 | 100,968 | 91,706 | 120,798 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු/භාණ්ඩ හා සේවා බද්ද | 32,300 | 36,429 | 37,631 | 43,492 | 47,130 | 39,343 | 58,111 |
| නිෂ්පාදන | 9,171 | 9,906 | 8,874 | 9,475 | 10,255 | 9,121 | 11,993 |
| නිෂ්පාදන නොවන | 6,445 | 7,074 | 9,711 | 13,328 | 10,800 | 12,690 | 19,590 |
| ආනයන | 16,684 | 19,449 | 19,046 | 20,689 | 23,975 | 17,532 | 26,528 |
| සුරාබදු | 14,632 | 19,436 | 22,067 | 24,775 | 31,464 | 30,293 | 34,544 |
| මත්පැන් | 4,686 | 6,298 | 5,839 | 6,181 | 8,369 | 7,665 | 9,192 |
| දුම්කොළ | 7,888 | 8,788 | 12,833 | 14,139 | 16,295 | 15,051 | 17,002 |
| වෙනත් | 2,058 | 4,350 | 3,395 | 4,455 | 6,800 | 7,577 | 8,350 |
| ජාතික ආරක්ෂක බද්ද | 9,693 | 14,408 | 16,441 | 17,338 | 20,500 | 21,079 | 26,700 |
| බලපත්‍ර ගාස්තු | 60 | 524 | 966 | 1,145 | 1,874 | 991 | 1,443 |
| ජාත්‍යන්තර වෙළෙඳම මත බදු | 22,598 | 24,373 | 25,464 | 26,743 | 30,960 | 28,154 | 31,127 |
| ආනයන | 22,598 | 24,365 | 25,459 | 26,739 | 30,960 | 28,154 | 31,127 |
| අපනයන | - | 8 | 5 | 4 | - | - | - |
| **බදු නොවන ආදායම** | **10,621** | **17,715** | **16,077** | **22,524** | **24,389** | **27,664** | **28,910** |
| දේපල ආදායම | 7,360 | 12,011 | 10,059 | 15,022 | 15,178 | 18,462 | 18,895 |
| ඉන් : මහ බැංකුවේ ලාභ | 1,200 | 1,200 | 1,700 | 1,500 | 2,650 | 2,650 | 3,000 |
| පොළී ආදායම | 4,560 | 6,991 | 5,222 | 8,002 | 7,108 | 7,786 | 7,050 |
| ගාස්තු සහ අයකිරීම් | 988 | 1,751 | 2,827 | 2,800 | 2,858 | 2,890 | 3,329 |
| අනෙකුත් බදු නොවන ආදායම් | 2,273 | 3,953 | 3,191 | 4,702 | 6,353 | 6,312 | 6,686 |
| **මුළු ආදායම** | **110,038** | **136,258** | **146,279** | **165,036** | **188,437** | **175,032** | **214,320** |

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998 අනුමත ඇස්තමේන්තු | 1998 තාවකාලික | 1999 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **17.2** | **17.8** | **17.0** | **16.0** | **18.4** | **14.5** | **16.0** |
| ආදායම් බදු | 2.6 | 2.6 | 2.7 | 2.4 | 2.7 | 2.0 | 2.1 |
| පෞද්ගලික | 1.0 | 1.1 | 1.0 | 0.9 | 1.0 | 0.8 | 0.9 |
| සාමූහික | 1.7 | 1.5 | 1.7 | 1.5 | 1.7 | 1.2 | 1.2 |
| ජාතිය රැකගැනීමේ අරමුදල | - | - | | | 0.1 | 0.1 | 0.1 |
| දේපල මත බදු | 0.8 | 0.8 | 0.7 | 0.7 | 0.9 | 0.7 | 0.8 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් මත බදු | 0.1 | 0.2 | 0.2 | 0.1 | - | - | - |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 9.8 | 10.6 | 10.0 | 9.7 | 11.3 | 9.0 | 10.4 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු/භාණ්ඩ හා සේවා බද්ද | 5.6 | 5.5 | 4.9 | 4.9 | 5.3 | 3.9 | 5.0 |
| නිෂ්පාදන | 1.6 | 1.5 | 1.2 | 1.1 | 1.2 | 0.9 | 1.0 |
| නිෂ්පාදන නොවන | 1.1 | 1.1 | 1.3 | 1.5 | 1.2 | 1.3 | 1.7 |
| ආනයන | 2.9 | 2.9 | 2.5 | 2.3 | 2.7 | 1.7 | 2.3 |
| සුරාබදු | 2.5 | 2.9 | 2.9 | 2.8 | 3.5 | 3.0 | 3.0 |
| මත්පැන් | 0.8 | 0.9 | 0.8 | 0.7 | 0.9 | 0.8 | 0.8 |
| දුම්කොළ | 1.4 | 1.3 | 1.7 | 1.6 | 1.8 | 1.5 | 1.5 |
| වෙනත් | 0.4 | 0.7 | 0.4 | 0.5 | 0.8 | 0.7 | 0.7 |
| ජාතික ආරක්ෂක බද්ද | 1.7 | 2.2 | 2.1 | 1.9 | 2.3 | 2.1 | 2.3 |
| බලපත්‍ර ගාස්තු | - | 0.1 | 0.1 | 0.1 | 0.2 | 0.1 | 0.1 |
| ජාත්‍යන්තර වෙළෙඳම මත බදු | 3.9 | 3.6 | 3.3 | 3.0 | 3.5 | 2.8 | 2.7 |
| ආනයන | 3.9 | 3.6 | 3.3 | 3.0 | 3.5 | 2.8 | 2.7 |
| අපනයන | - | - | - | - | - | - | - |
| **බදු නොවන ආදායම** | **1.8** | **2.7** | **2.1** | **2.5** | **2.7** | **2.7** | **2.5** |
| දේපල ආදායම | 1.3 | 1.8 | 1.3 | 1.7 | 1.7 | 1.8 | 1.6 |
| ඉන් : මහ බැංකුවේ ලාභ | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.3 | 0.3 | 0.3 |
| පොළී ආදායම | 0.8 | 1.0 | 0.7 | 0.9 | 0.8 | 0.8 | 0.6 |
| ගාස්තු සහ අයකිරීම් | 0.2 | 0.3 | 0.4 | 0.3 | 0.3 | 0.3 | 0.3 |
| අනෙකුත් බදු නොවන ආදායම් | 0.4 | 0.6 | 0.4 | 0.5 | 0.7 | 0.6 | 0.6 |
| **මුළු ආදායම** | **19.0** | **20.4** | **19.0** | **18.5** | **21.2** | **17.3** | **18.5** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහළ දැමීම, සියළුම සැර මත්පැන් මත සුරා බදු සියයට 10 න් තවදුරටත් ඉහළ දැමීම සහ 1998 නොවැම්බර් මස සිට බීර සඳහා මධ්‍යසාර ප්‍රතිශතය අනුව සුරා බදු අය කිරීමත් යන කරුණුවල ඒකාබද්ධ ප්‍රතිඵලයකි. මීට අතරව, සියළුම සැර මත්පැන් වර්ගවල සහ බීරවල නිෂ්පාදන ප්‍රමාණය ඉහළ යෑමද සුරා බදු ආදායම වැඩි වීමට හේතු විය. 1998 වර්ෂයේදී සැර මත්පැන්වල නිෂ්පාදනය සියයට 12 කින් ඉහළ ගිය අතර, ලීටර මිලියන 28 ක ධාරිතාවයකින් යුතු නව බීර කම්හල් 2 ක් මෙම වසර තුළදී නිෂ්පාදන ක්‍රියාවලියට එකතු වීමත් සමඟ බීර නිෂ්පාදනය සියයට 45 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. සිගරට් සහ මත්පැන් හැර නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත යටතේ එකතු කරගත් බදු 1998 දී සැලකිය යුතු වර්ධනයක් (සියයට 70) වාර්තා කරන ලදී. මෙම ආදායම් ශීර්ෂයේ වැදගත් අංගයක් වන පෙට්‍රල් හා.සේ.බ.න් නිදහස් කිරීම නිසා ඇති වන ආදායමේ හිඟය පියවීම සඳහා පෙට්‍රල් මත නිෂ්පාදන බදු සියයට 25 සිට සියයට 50 දක්වා ඉහළ දමන ලදී. මෙම සංශෝධනය සහ පෙට්‍රල් විකුණුම්වල සියයට 4 ක වර්ධනය යන කරුණු ඒකාබද්ධව, රුපියල් දශ ලක්ෂ 1,500 ක පමණ ආදායමක් හා.සේ.බ. න් නිෂ්පාදන බදුවලට මාරු වීමට හේතු විය. 1998 නොවැම්බර් මස සිට සියළුම ආනයනික පෞද්ගලික වාහන සඳහා අමතර සියයට 10 ක නිෂ්පාදන බද්දක් අය කිරීම නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත යටතේ ලැබුණු ආදායම ඉහළ නැංවීමට දායක විය.

ජාතික ආරක්ෂක බද්ද 1998 දී සියයට 22 ක සැළකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 21,079 ආදායමක් රැස්කරන ලදි. ජා.ආ.බ. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.1 ක් වූ අතර මුළු බදු ආදායමෙන් එය සියයට 14 ක් විය. සේවා අංශයේ ප්‍රසාරණයත් බදු අය කළහැකි සේවාවල (විදුලි සංදේශ, විදුලිය) මිල ඉහළට සංශෝධනය කිරීමත්, 1998 වසර අවසන් භාගයේදී ජා.ආ.බ. අනුපාතය සියයට 4.5 සිට සියයට 5.5 දක්වා වැඩි කිරීමත් මෙම මූලාශ්‍රයේ ආදායම වැඩි වීමට දායක විය. ඒ අනුව 1998 දී දේශීය කටයුතු වලින් එකතු කරගත් ජා.ආ.බ. ආදායම සියයට 20 කින් ඉහළ ගිය අතර, ආනයන මඟින් එකතු කර ගත් ආදායම සියයට 18 ක අඩු වර්ධනයක් වාර්තා කරන ලදී. මේ අනුව ආනයන මත ජා.ආ.බ. මුළු ජා.ආ.බ. කොටසක් ලෙස 1997 පැවති සියයට 65 සිට 1998 දී සියයට 63 දක්වා අඩු විය.

1998 දී ආනයන වටිනාකමෙහි සියයට 10 ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කලද, පසුගිය වසරේදී මෙන්ම මෙම වසරේදීද ආනයන තීරු බදු මඟින් එකතු කර ගත් ආදායම සියයට 5 කින් පමණක් වැඩි වී රුපියල් දශ ලක්ෂ 28,154 ක් විය. සාමාන්‍ය තීරු බදු අනුපාතය එනම් තීරු බදු ආදායම මුළු ආනයන වටිනාකමේ අනුපාතයක් ලෙස 1997 පැවති සියයට 7.7 සිට 1998 දී සියයට 7.4 දක්වා ආන්තිකව අඩු විය. නූල් රෙදිපිළි හා රෙදිපිළි කර්මාන්තයට අවශ්‍ය අතරමැදි හා ප්‍රාග්ධන භාණ්ඩවල ආනයන තීරු බදු ඉවත් කිරීම සහ කෘෂිකර්මය, ධීවර කර්මාන්ත, විදුලි සංදේශ, පරිසනක මෘදුකාංග සහ සංචාරක වැනි ප්‍රමුඛ අංශවලට එවැනිම පහසුකම් සැලසීම පිණිස ලබා දුන් සහන ආනයන තීරු බදු ආදායමේ මන්දගාමී වර්ධනයට මූලික ලෙස බලපාන ලදී. නව බදු සහන හේතුවෙන් 1998 දී බදු අය කළහැකි ආනයන මත තීරු බදු සියයට 5 ක වර්ධනයකට සීමා විය. ඒ අනුව මුළු ආනයන ප්‍රමාණයෙන් බදු අය කළහැකි ආනයනවලට හිමි ප්‍රමාණය 1997 දී සියයට 37 සිට 1998 දී සියයට 35 දක්වා පහත වැටුණු අතර, ආනයන මත සඵල තීරු බදු අනුපාතය 1998 දී සියයට 20.9 ක් ලෙස නොවෙනස්ව පැවතුනි. තීරු බදු ව්‍යුහය යථාර්ථවාදී කිරීම නිසා 1994 පැවති සියයට 10, 20 හා 35 තීරු බදු අනුපාතයන් 1998 දී සියයට 5, 10 සහ 30 දක්වා පහතට සංශෝධනයන් කිරීමත්, තීරු බදු අය කළහැකි ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයනවල 1998 දී ජාත්‍යන්තර මිල මට්ටම් පහත වැටීමත් ආනයන මත තීරු බදු එකතුවේ මන්දගාමී වර්ධනයට දායක විය.

1998 දී ආදායම් බදු වලින් ලැබුණු ආදායම සියයට 5 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 20,429 ක් වූ අතර එයට සාමූහික නොවන ආදායම් බදු ආන්තික ලෙස රුපියල් දශ ලක්ෂ 8,099 කට අඩු වීමත්, සාමූහික බදු සියයට 10 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 11,788 ක් වීමත් හේතුවිය. ජාතිය රැක ගැනීමේ අරමුදල යටතේ එකතු කර ගත් ආදායම රුපියල් දශ ලක්ෂ 327 සිට රුපියල් දශ ලක්ෂ 542 දක්වා වැඩි විය. ආදායම් බදු, මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 1997 සියයට 15.1 සිට 1998 දී සියයට 13.8 දක්වා අඩු වුණු අතර, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1997 පැවැති සියයට 2.4 සිට 1998 සියයට 2 දක්වා පහත වැටුණි. සියළුම ආදායම් බදු ගෙවන්නන් සඳහා බද්දෙන් නිදහස් ආදායම් සීමාව රු. 144,000 දක්වා වූ ඒකීය මට්ටමකට ගෙන ඒම, බදු ස්ථරයන් රුපියල් 100,000 දක්වා පුළුල් කිරීම සහ පොලී ආදායම් මත රැඳවුම් බද්ද 1997 දී පැවති සියයට 15 සිට 10 දක්වා අඩු කිරීම සාමූහික නොවන ආදායම් බදු අඩු වීමට දායක විය. 1998 දී සාමූහික ආදායම් බදු සියයට 11 ක අඩු වීමක් පෙන්නුම් කළේය. කෘෂිකර්මය, ධීවර, පශු සම්පත් හා සංචාරක වැනි ප්‍රමුඛ අංශයන්හි සාමූහික ආදායම් බදු සියයට 15 දක්වා අඩු කිරීම, නිෂ්පාදන ව්‍යවසායයන් සඳහා ආයෝජන බදු සහන ලබා දීම, ප්‍රමුඛ කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා ආයෝජන මණ්ඩලය යටතේ බදු සහන ලබාදීම, මෘදුකාංග කර්මාන්ත සහ ප්‍රාදේශීය කර්මාන්තකරණය වැඩි දියුණු කිරීමට ලබා දුන් බදු සහනයන් යන කරුණු සාමූහික ආදායම් බදුවල පහත වැටීමේ ප්‍රවනතාවයට දායක වූ ප්‍රධාන හේතුන් ලෙස හඳුනාගත හැක.

මුද්දර බදු ආදායම 1997 දී සියයට 21 ක ඉහළ යෑම හා සසඳනවිට 1998 දී සියයට 11 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 7,069 ක් විය. පොරොන්දු නෝට්ටු, භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම්, උකස් දුරකුම් ආදී මූල්‍යමය උපකරණවල මුද්දර ගාස්තු අඩු කිරීම සහ ඉන් අනතුරුව 1998 නොවැම්බර් මස සිට පොරොන්දු නෝට්ටු, භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් වැනි ණය උපකරණවලින් මුද්දර ගාස්තු ඉවත් කිරීම මෙම ශීර්ෂයේ ආදායමේ මන්දගාමී වර්ධනයට හේතු විය. 1998 ආනයනවල මන්දගාමී වර්ධනයද ආනයන මත මුද්දර බදුවල ආදායමට බලපෑවේය.

ඩීසල් සහ සුඛෝපභෝගී බදු ගෙවීමට නියමිත වාහන ප්‍රමාණයේ වැඩි වීමක් තිබියදීත් එම ආදායම් මාර්ගයෙන් ලැබුණු ආදායම සියයට 14 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 991 ක් විය. ද්විත්ව බදු ක්‍රමය වෙනුවට 1997 අප්‍රේල් 1 සිට ක්‍රියාත්මක කරන ලද අඩු මට්ටමක වූ රු. 5,000 ඒකීය බද්දක් ඩීසල් වාහන මත පැනවීම මෙම ආදායමේ පහත වැටීමට යම්දුරකට බලපාන ලදී. මෙම බද්ද පිළිබඳ අධීක්ෂණ කටයුතුවල පවතින දුර්වලතාවයද ආදායමේ අඩු වීමට හේතු විය.

## බදු නොවන ආදායම්

බදු නොවන ආදායම, 1997 පැවති රුපියල් දශ ලක්ෂ 22,524 සිට 1998 දී සියයට 23 කින් ඉහළ ගොස් රුපියල් දශ ලක්ෂ 27,664 ක් විය. මුළු ආදායමින් බදු නොවන ආදායම් කොටස 1996 සහ 1997 වර්ෂවල පිළිවෙලින් පැවති සියයට 11 සහ සියයට 14 හා සසඳනවිට මෙම වර්ෂයේදී සියයට 16 ක් විය. 1998 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.7 ක් වූ බදු නොවන ආදායම 1997 මට්ටමට වඩා ආන්තික වැඩි වීමක් පෙන්වයි. මෙම බදු නොවන ආදායමේ වර්ධනය බදු ආදායමේ පහත වැටීම නිසා ඇති වූ හිඟයෙන් කොටසක් ආවරණය කර ගැනීමට උපකාරී විය. බදු නොවන ආදායමෙන් සියයට 67 ක් වන දේපල ආදායම ප්‍රධාන වශයෙන් රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් ලැබුණු පොලී, බදු කුලී, ලාභ ලාභාංශවල ඉහළ යෑම හේතුවෙන් සියයට 23 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. පොලී ලැබීම් 1998 දී රුපියල් දශලක්ෂ 7,786 වූ අතර එය 1998 අයවැය මගින් බලාපොරොත්තු වූ රුපියල් දශලක්ෂ 7,108 වඩා වැඩි වූ අතර එම වැඩිවීමට හිඟ අයකිරීම් සහ ලංකා විදුලිබල මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 3,069), ශ්‍රී ලංකා වරාය අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 727) වැනි රාජ්‍ය ව්‍යවසායයන්ගේ පොලී ගෙවීම් කටයුතු සඳහා නිශ්චිත කාලසීමාවන් ලබා දී ඒවා තදින් ක්‍රියාත්මක කිරීම හේතු වුනි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරුම් 1997 වූ රුපියල් දශ ලක්ෂ 1,500 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 2,650 දක්වා ඉහළ ගියේය. මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සඳහා අය කෙරුණු රැඳවුම් බද්ද ඉවත් කිරීම නිසා ඇති වුණු ආදායම් අඩු වීම මෙම මහ බැංකුවේ ලාභ පැවරුම් ඉහළ යෑම නිසා ආවරණය විය. මහ බැංකු ලාභ හැර, ලාභ ලාභාංශ සහ අයකිරීම් 1997 පැවති රුපියල් දශ ලක්ෂ 4,284 සිට සියයට 44 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 6,190 ක් විය. ශ්‍රී ලංකා වරාය අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 2,350), ලංකා ඛනිජ තෙල් සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 500) සහ එයාර් ලංකා සමාගම (රුපියල් දශ ලක්ෂ 632) මෙහි ප්‍රධාන දායකයන් විය. මේ අතර මුදල් පනත යටතේ ලංකා බැංකුවෙන් රුපියල් දශ ලක්ෂ 1,000 ක විශේෂ අය කිරීමක් කරන ලදී. ප්‍රතිව්‍යුහගත බැඳුම්කර වෙනුවෙන් ගෙවන පොලියෙන් රජයට ලැබිය යුතු කොටස ලෙස ලංකා බැංකුවෙන් රුපියල් දශ ලක්ෂ 658 ක් සහ මහජන බැංකුවෙන් රුපියල් දශ ලක්ෂ 572 ක් රජය විසින් ආපසු ලබා ගන්නා ලදී. මූලික වශයෙන් පෞද්ගලීකරණය කරන ලද වතු සමාගම් වලින් එකතු කරන ලද බදු කුලී නිසා 1998 වර්ෂයේ බදු කුලී මගින් එකතු කල ආදායම සියයට 66 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,410 ක් විය. විශේෂ ගාස්තු හා අය කිරීම්, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සේවා නියුක්තියන්ගේ දායක මුදල්, කාර්මික නොවන විකුණුම් වැනි අනිකුත් බදු නොවන ආදායම් ශීර්ෂයන්ද සියයට 23 ක තියුණු වැඩි වීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 9,202 ක් විය. මෙම මූලාශ්‍රයන් 1998 බදු නොවන ආදායම වැඩි වීමට දායක විය.

## විදේශ ප්‍රදානයන්

1998 දී ණය නොවන විදේශ අධාර ලැබීමේ අඩු වීමක් පිළිබිඹු කරමින් අයවැය කටයුතු සඳහා භාවිතා කරන ලද මුළු විදේශ ප්‍රදානයන් සියයට 2 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 7,200 ක් විය. විදේශ ප්‍රදානයන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 0.7 ක් වූ අතර මෙය 1997 ප්‍රමාණයට වඩා ආන්තික අඩු වීමකි. රජයේ ආයෝජන ව්‍යාපෘතීන් මූල්‍යනය කළ ව්‍යාපෘති ප්‍රදානයන් රුපියල් දශ ලක්ෂ 4,750 ක් විය. 1998 දී මුළු ප්‍රදානයන්ගෙන් සියයට 46 ක් ලබා දෙමින් ජපානය තවදුරටත් විශාලතම ප්‍රදානයන් ලබා දෙන්නා වූ අතර, සියයට 22 ක් ලබා දෙමින් ඉන්දියාව ඊට පිටුපසින් විය.

## 8.4 වියදම


1998 වර්ෂය තුළදී රජයේ මුළු වියදම සහ ශුද්ධ ණය දීම් සියයට 14 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 268,179 ක් විය. මුළු වියදම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස සැලකුවිට 1997 වර්ෂයේ පැවති සියයට 26.4 මට්ටමෙහිම පැවතිණි. කෙසේ වුවද, එම වියදම 1998 අයවැය මගින් බලාපොරොත්තු වූ සියයට 24.9 වඩා ඉහළ අගයක පැවතිණි. ආරක්ෂක වියදම් සහ වැටුප් හා වේතන වැඩි වීම සහ රාජ්‍ය ආයෝජනය සැලකිය යුතු ලෙස ඉහළ යෑම රජයේ මුළු වියදම් වැඩි වීමට හේතු වූ ප්‍රධානම කරුණු ලෙස දැක්විය හැක. කෙසේ වුවද, වර්තන වියදම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1997 පැවති සියයට 20.8 සිට 1998 වර්ෂයේදී සියයට 19.7 දක්වා අඩු වූ අතර ඒ සඳහා රාජ්‍ය ණය සඳහා වූ පොලී ගෙවීම්වල අඩු වීම මූලිකව හේතු විය. 1997 දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස සියයට 5.8 ක් වූ රාජ්‍ය ආයෝජනය 1998 දී සියයට 6.7 ක් දක්වා ඉහළ යන ලදී.

## වර්තන වියදම්

1998 දී වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 199,648 ක් වූ අතර එය 1997 හා සැසඳීමේදී සියයට 8 ක වැඩි වීමකි. වර්තන වියදම මුළු වියදමෙහි ප්‍රතිශතයක් ලෙස ගත්කළ 1997 පැවති සියයට 78.6 සිට සියයට 74.4 දක්වා අඩු විය. පොලී ගෙවීම් සහ වර්තන පැවරුම් සහ සහනාධාර වියදම්හි සිදු වූ අඩු වීම මගින් වර්තන වියදමේ වර්ධනය වලක්වනු ලැබීය. 1998 දී පොලි ගෙවීම් සුළු වශයෙන් අඩුවී රුපියල් දශලක්ෂ 54,897 විය. දළ දේශීය නිෂ්පාදිතයේ

ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම් 1997 පැවති සියයට 6.2 සිට 1998 දී 5.4 දක්වා අඩු විය. 1998 දී රුපියල් දශ ලක්ෂ 46,984 ක් වූ වර්තන පැවරුම් සහ සහනාධාර වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1997 පැවති සියයට 5.1 සිට 4.6 දක්වා අඩු විය. 1998 දී ආරක්ෂක සහ ආරක්ෂක කටයුතු සම්බන්ධ අනිකුත් වියදම් සියයට 13 කින් වැඩි වූ අතර, එය මුළු වර්තන වියදමින් සියයට 26 ක් විය. ආරක්ෂක වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1997 දී පැවති සියයට 5 ක මට්ටමේම මෙම වසරේදීද පැවතිණි. මේ අතර මධ්‍යම රජයේ සහ පළාත් සභා සේවකයින්ගේ වැටුප් හා වේතන සහ රාජ්‍ය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලින් කරනු ලැබූ වෙනත් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සඳහා දරනු ලැබූ වියදම් සියයට 21 ක සැලකිය යුතු වැඩි වීමක් 1998 දී වාර්තා කරනු ලැබූ අතර එම වැඩි වීම 1997 දී සියයට 5 ක් විය.

**8.3 රූප සටහන**
**වියදම් සංයුතිය**




1998 දී මුළු වැටුප් සහ වේතන වියදම සියයට 21 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 53,880 ක් විය. 1997 දී එම වැඩි වීම සියයට 17 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වැටුප් හා වේතන වියදම 1997 පැවති සියයට 5 හා සසඳනවිට 1998 දී සියයට 5.3 දක්වා වැඩි විය. වැටුප් හා වේතන වියදම්හි මෙම වැඩි වීමට උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි ආරක්ෂක මෙහෙයුම්වල නියැලි හමුදා සෙබළුන්ට කරන ලද දීමනා වැඩි වීම සහ 1995 වැටුප් කොමිසම මගින් නිර්දේශිත වැටුප් වැඩි කිරීමේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම හේතුවිය.

රාජ්‍ය අංශයේ සේවකයිනට අදියර දෙකකින් ක්‍රියාත්මක කරන ලද නව වැටුප් ව්‍යුහය 1998 දී සම්පූර්ණ කරන ලදී. පළවන අදියරයේදී යෝජිත වැටුප් වැඩි කිරීමෙන් සියයට 40 ක් 1997 ජනවාරි මස සිට සියළුම සේවකයිනට ලබා දෙන ලදී. එම වැටුප් වැඩි කිරීමේ ඉතිරි සියයට 60 දෙවන අදියර යටතේ 1998 ජනවාරි මස සිට ලබා දීමට සැළසුම් කර තිබුනද සම්පත් හිඟකම නිසා නැවත කොටස් දෙකකින් ලබා දීම කරන ලදී. ඒ අනුව, ආරක්ෂක අංශයේ සේවයේ නියුතු සියළු දෙනාටම සහ රාජ්‍ය අංශයේ මාසික වැටුප රුපියල් 7,500 ට අඩු අනෙකුත් සේවකයිනට පමණක් 1998 ජනවාරි මස සිට ඉතිරි වැටුප් වැඩි වීම ලබා දෙන ලදී. ඉහත වැටුප් මට්ටමට වඩා වැඩි වැටුපක් ලබන සේවකයිනට වැටුප් වැඩි කිරීමේ දෙවන අදියර 1998 ජූලි මස සිට ලබා දෙන ලදී.

අයවැය හිඟය අඩු කරමින් පසුගිය වර්ෂ දෙක තුළදී ලැබූ ප්‍රගතිය, සාපේක්ෂව පැවති පහළ උද්ධමන අනුපාතිකය සහ මූල්‍ය සහ රාජ්‍ය ණය කළමනාකාරිත්වයෙහි සිදු වූ දියුණුව පොලී වියදම අඩු වීම කෙරෙහි හේතු විය. දේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් අඩුවීමේ හේතුවෙන් රාජ්‍ය ණය සඳහා වූ මුළු පොලී ගෙවීම් ආන්තික ලෙස අඩු වී රුපියල් දශ ලක්ෂ 54,897 ක් විය. 1997 වර්ෂයේ පැවති පොලී අනුපාතිකයන්හි සිදු වූ අඩු වීම මීට හේතු විය. දේශීය ණය සඳහා කරනු ලැබූ මුළු පොලී ගෙවීම්, වර්ෂය අවසානයේ පැවති මුළු දේශීය ණය ප්‍රමාණයේ අනුපාතයක් ලෙස 1997 දී සියයට 12.7 සිට 1998 දී සියයට 11 දක්වා අඩු විය. ණය කළමනාකරණයේ ප්‍රගතියක් ඇති කිරීම විශේෂයෙන්ම රජයේ සුරැකුම්පත් අවදානම් රහිත ණය උපකරණයක් ලෙස මහජනතාව අතර ප්‍රචලිත කිරීම තවදුරටත් පොලී අනුපාතික පහත හෙළීමට උපකාරී විය හැක. මේ යටතේ අයවැය හිඟය අඩුකිරීමේ වැදගත්කම අවධාරණය කිරීම කළ යුතුය.

1998 දී නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,000 කින් වැඩි වුවද, භාණ්ඩාගාර බිල්පත් සඳහා කරනු ලැබූ පොලී ගෙවීම් 1998 දී සියයට 31 ක් කැපී පෙනෙන ලෙස පහත වැටිණි. භාණ්ඩාගාර බිල්පත් සඳහා ගෙවන ලද පොලී ප්‍රමාණය වර්ෂය අවසානයේ පැවැති මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයේ අනුපාතයක් ලෙස සියයට 15.7 සිට 1998 දී සියයට 10.3 දක්වා අඩු විය. 1997 දී රුපියල් දශ ලක්ෂ 10,000 ක භාණ්ඩාගාර බිල්පත් ගෙවා නිදහස් වීම නිසා 1998 දී පොලී වියදමේ සිදු වූ අඩු වීම රුපියල් දශ ලක්ෂ 350 ක් විය.

## 8.3 සංඛ්‍යා සටහන
## ආර්ථික වර්ගීකරණයට අනුව වියදම සහ ශුද්ධ ණයදීම(අ)

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998 අනුමත ඇස්තමේන්තු | 1998 තාවකාලික | 1999 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | **127,084** | **154,159** | **175,148** | **184,749** | **187,090** | **199,648** | **199,205** |
| භාණ්ඩ හා සේවා වියදම | 54,700 | 75,447 | 80,003 | 83,831 | 85,604 | 97,768 | 91,976 |
| වැටුප් හා වේතන | 29,309 | 34,909 | 38,332 | 44,677 | 47,855 | 53,880 | 54,292 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 25,391 | 40,538 | 41,671 | 39,154 | 37,749 | 43,888 | 37,684 |
| පොළී ගෙවීම් | 38,031 | 38,225 | 48,923 | 55,246 | 55,367 | 54,897 | 59,780 |
| විදේශීය | 5,511 | 6,162 | 6,739 | 6,692 | 7,418 | 7,300 | 8,060 |
| දේශීය (ආ) | 32,520 | 32,063 | 42,184 | 48,554 | 47,949 | 47,598 | 51,720 |
| වර්තන පැවරුම් හා සහනාධාර | 34,180 | 40,487 | 46,223 | 45,672 | 45,419 | 46,984 | 47,749 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 2,634 | 7,841 | 8,232 | 2,693 | 2,374 | 2,967 | 2486 |
| රාජ්‍ය ආයතනයන්ට | 1,976 | 2,182 | 2,284 | 2,657 | 5,381 | 4,320 | 6033 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 1,307 | 1,157 | 1,592 | 1,941 | 1,524 | 1,977 | 2103 |
| කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 28,263 | 29,307 | 34,114 | 38,381 | 36,140 | 37,719 | 37,127 |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර යනාදිය | 4,654 | 1,799 | 591 | - | - | - | - |
| ජනසවිය/සමෘද්ධි | 5,369 | 5,130 | 8,591 | 8,718 | 9,670 | 8,652 | 8374 |
| විශ්‍රාම වැටුප් | 13,271 | 14,549 | 15,465 | 17,916 | 18,285 | 19,477 | 19321 |
| පොහොර සහනාධාර | 630 | 1,345 | 1,500 | 1,895 | 1,500 | 2,152 | 1500 |
| වෙනත් | 4,339 | 6,484 | 7,967 | 9,852 | 6,685 | 7,438 | 7932 |
| ඌණ/අනපේක්ෂිත වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | 700 | - | -300 |
| **ප්‍රාග්ධන වියදම්** | **30,391** | **41,722** | **37,638** | **43,982** | **57,339** | **54,160** | **68,736** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 16,747 | 22,589 | 20,938 | 25,468 | 35,185 | 32,246 | 37,734 |
| ප්‍රාග්ධන පැවරුම් | 13,644 | 19,134 | 16,701 | 18,514 | 22,153 | 21,915 | 33,597 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 4,246 | 7,614 | 6,017 | 5,880 | 6,396 | 6,801 | 9828 |
| රාජ්‍ය ආයතනයන්ට | 8,433 | 10,446 | 9,603 | 11,041 | 13,980 | 13,285 | 19261 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 914 | 1,057 | 1,042 | 1,511 | 1,745 | 1,764 | 1975 |
| වෙනත් | 51 | 17 | 39 | 83 | 32 | 65 | 2533 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | - | - | -2595 |
| **ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම** | **13,289** | **7,602** | **5,873** | **6,366** | **10,656** | **14,370** | **15,322** |
| අත්තිකාරම් ගිණුම් | 2,462 | 1,580 | 630 | 1,226 | 500 | 2,784 | 500 |
| ණයදීම | 10,064 | 11,087 | 8,335 | 7,278 | 13,658 | 14,117 | 15820 |
| ප්‍රතිව්‍යුහකරණ පිරිවැය | 3,739 | 3,191 | 90 | 2,193 | 1,500 | 3,688 | 3980 |
| ණය ආපසු ගෙවීම් | -2,976 | -5,097 | -3,182 | -4,331 | -5,002 | -6,218 | -4978 |
| **මුළු වියදම සහ ශුද්ධ ණය දීම** | **170,764** | **203,483** | **218,659** | **235,096** | **255,085** | **268,179** | **283,263** |

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998 අනුමත ඇස්තමේන්තු | 1998 තාවකාලික | 1999 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | **21.9** | **23.1** | **22.8** | **20.8** | **18.2** | **19.7** | **19.6** |
| භාණ්ඩ හා සේවා වියදම | 9.4 | 11.3 | 10.4 | 9.4 | 8.3 | 9.6 | 9.1 |
| වැටුප් හා වේතන | 5.1 | 5.2 | 5.0 | 5.0 | 4.7 | 5.3 | 5.4 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 4.4 | 6.1 | 5.4 | 4.4 | 3.7 | 4.3 | 3.7 |
| පොළී ගෙවීම් | 6.6 | 5.7 | 6.4 | 6.2 | 5.4 | 5.4 | 5.9 |
| විදේශීය | 1.0 | 0.9 | 0.9 | 0.8 | 0.7 | 0.7 | 0.8 |
| දේශීය (ආ) | 5.6 | 4.8 | 5.5 | 5.5 | 4.7 | 4.7 | 5.1 |
| වර්තන පැවරුම් හා සහනාධාර | 5.9 | 6.1 | 6.0 | 5.1 | 4.4 | 4.6 | 4.7 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 0.5 | 1.2 | 1.1 | 0.3 | 0.2 | 0.3 | 0.2 |
| රාජ්‍ය ආයතනයන්ට | 0.3 | 0.3 | 0.3 | 0.3 | 0.5 | 0.4 | 0.6 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.1 | 0.2 | 0.2 |
| කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 4.9 | 4.4 | 4.4 | 4.3 | 3.5 | 3.7 | 3.7 |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර යනාදිය | 0.8 | 0.3 | 0.1 | - | - | - | - |
| ජනසවිය/සමෘද්ධි | 0.9 | 0.8 | 1.1 | 1.0 | 0.9 | 0.8 | 0.8 |
| විශ්‍රාම වැටුප් | 2.3 | 2.2 | 2.0 | 2.0 | 1.8 | 1.9 | 1.9 |
| පොහොර සහනාධාර | 0.1 | 0.2 | 0.2 | 0.2 | 0.1 | 0.2 | 0.1 |
| වෙනත් | 0.7 | 1.0 | 1.0 | 1.1 | 0.6 | 0.7 | 0.8 |
| ඌණ/අනපේක්ෂිත වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | 0.1 | - | - |
| **ප්‍රාග්ධන වියදම්** | **5.2** | **6.2** | **4.9** | **4.9** | **5.6** | **5.3** | **6.8** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 2.9 | 3.4 | 2.7 | 2.9 | 3.4 | 3.2 | 3.7 |
| ප්‍රාග්ධන පැවරුම් | 2.4 | 2.9 | 2.2 | 2.1 | 2.2 | 2.2 | 3.3 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 0.7 | 1.1 | 0.8 | 0.7 | 0.6 | 0.7 | 1.0 |
| රාජ්‍ය ආයතනයන්ට | 1.5 | 1.6 | 1.3 | 1.2 | 1.4 | 1.3 | 1.9 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 0.2 | 0.2 | 0.1 | 0.2 | 0.2 | 0.2 | 0.2 |
| වෙනත් | - | - | - | - | - | - | 0.2 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | - | - | -0.3 |
| **ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම** | **2.3** | **1.1** | **0.8** | **0.7** | **1.0** | **1.4** | **1.5** |
| අත්තිකාරම් ගිණුම් | 0.4 | -0.2 | 0.1 | 0.1 | - | 0.3 | - |
| ණයදීම | 1.7 | 1.7 | 1.1 | 0.8 | 1.3 | 1.4 | 1.6 |
| ප්‍රතිව්‍යුහකරණ පිරිවැය | 0.6 | 0.5 | - | 0.2 | 0.1 | 0.4 | 0.4 |
| ණය ආපසු ගෙවීම් | -0.5 | -0.8 | -0.4 | -0.5 | -0.5 | -0.6 | -0.5 |
| **මුළු වියදම සහ ශුද්ධ ණය දීම** | **29.5** | **30.5** | **28.5** | **26.4** | **24.9** | **26.4** | **27.9** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1996 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යානවල (GFS) මඟපෙන්වීම මත පෙරදී ශුද්ධ ණයදීම් යටතේ වර්ගීකරණය කරන ලද පුද්ගලීකරණ ලැබීම් දැන් මූල්‍යකරණ අයිතමයන් ලෙස සලකන අතර එමනිසා එම අයිතමය මෙම සංඛ්‍යා සටහනෙන් ඉවත් කරන ලදී.

(ආ) රාජ්‍ය බැංකුවලට සහ ජා.ඉ.බැ.ට නිකුත් කරන ලද දිගුකාලීන බැඳුම්කර සඳහා වූ පොළිය 1996 සිට ඇතුළත් කර ඇත.

1997 දී රුපියල් දශ ලක්ෂ 33,500 ක සහ 1998 දී රුපියල් දශ ලක්ෂ 11,000 ක නොපියවූ රුපියල් ණය ප්‍රමාණයේ වැඩි වීම පිළිබිඹු කරමින් රුපියල් ණය සඳහා කරනු ලැබූ පොලී ගෙවීම් 1998 දී සියයට 10 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 33,100 ක් විය. රුපියල් ණය සඳහා ගෙවන ලද පොලී ප්‍රමාණය වර්ෂය අවසානයේ පැවති මුළු නොපියවූ රුපියල් ණය ප්‍රමාණයේ අනුපාතයක් ලෙස සියයට 12.6 සිට 1998 දී සියයට 13.2 දක්වා වැඩිවිය. රුපියල් ණය කලින් ගෙවා නිදහස් කිරීමේ පහසුකම යටතේ සියයට 15-16 පොලී අනුපාතයක් සහිත රුපියල් ණය පියවා ඒ වෙනුවට සියයට 11-12.25 යටතේ කලින් ගෙවා නිදහස් කිරීමේ පහසුකම සහිත රුපියල් ණය නැවත නිකුත් කිරීම් නිසා 1998 දී පොලී වියදම රුපියල් දශ ලක්ෂ 180 කින් අඩු කර ගැනීමට හැකි විය. භාණ්ඩාගාර බැඳුම්කර මත කරනු ලැබූ පොලී වියදම 1997 දී පැවති රුපියල් දශ ලක්ෂ 327 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 2,100 දක්වා වැඩි වූ අතර ඒ සඳහා ස්ථාවර පොලී අනුපාතිකය සහිත රුපියල් ණය වෙනුවට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම වැඩි වීම ප්‍රධාන ලෙස හේතු විය.

නොපියවූ විදේශීය ණය ප්‍රමාණය 1998 දී සියයට 20 කින් වැඩි වුවද, එම ණය සඳහා කරනු ලැබූ පොලී ගෙවීම් සියයට 9 කින් පමණ වැඩි වී රුපියල් දශ ලක්ෂ 7,300 ක් විය. විදේශ ණය සඳහා වූ වාර්ෂික සාමාන්‍ය පොලී අනුපාතිකය පෙර වර්ෂයේ පැවති සියයට 1.8 සිට 1998 දී සියයට 1.6 දක්වා අඩු වූ අතර, එය එම ණයවල පවතින සහනදායී බව එමගින් පිළිබිඹු කරයි.

1998 දී වර්තන සංක්‍රාම සහ සහනාධාර ගෙවීම් සියයට 3 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 46,984 ක් විය. කෙසේ වුවද, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස මෙම සංක්‍රාම ගෙවීම් 1997 පැවති සියයට 5.1 සිට 4.6 දක්වා අඩු විය. සමෘද්ධි වැඩසටහන යටතේ සහනාධාර ලැබිය යුතු සමෘද්ධිලාභීන් තේරීමේ වැඩසටහන විධිමත් කිරීම නිසා 1998 දී මෙම සහනාධාරය ලැබෙන පවුල් සංඛ්‍යාව 44,671 න් අඩු කිරීම ආදී ක්‍රියාමාර්ග සහනාධාර වැඩසටහනෙහි ඒකාග්‍රතාවයක් ඇති කිරීමට රජය දරූ උත්සාහය නිසා කුටුම්බයනට කරනු ලබන සංක්‍රාම ගෙවීම්හි වැඩි වීම වලක්වා ගැනීමට හැකි විය.

විශ්‍රාම වැටුප්, සමෘද්ධි වැඩසටහන යටතේ ආධාර ලබා දීම, පොහොර සහනාධාරය සහ වෙනත් සහනාධාර ගෙවීම් ඇතුළත් කුටුම්බයනට කරනු ලැබූ මුළු සංක්‍රාම ගෙවීම් රුපියල් දශ ලක්ෂ 662 කින් ආනතික ලෙස අඩු වී රුපියල් දශ ලක්ෂ 37,719 ක් විය. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කුටුම්බයනට කරනු ලැබූ සංක්‍රාම ගෙවීම් 1997 පැවති සියයට 4.3 සිට 1998 දී සියයට 3.7 දක්වා අඩු විය. විශ්‍රාම වැටුප් ගෙවීම් සියයට 9 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 19,477 ක් වූ අතර එම වැඩි වීමට අළුතින් එකතු වූ විශ්‍රාමිකයින් 5,705 සහ 1995 දී ඉහළ නැංවීම ජීවන වියදම් දීමනාවේ හිඟ මුදල් 1998 තුළදී ගෙවීම යන කරුණු හේතු විය. විශ්‍රාම වැටුප් වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.0 සිට 1998 දී සියයට 1.9 දක්වා අඩු විය. පවුල් 1,973,183 කට සමෘද්ධි සහනාධාරය ලබා දුන් අතර පසුගිය වර්ෂයේ මෙම පවුල් සඳහා ලබා දුන් සමෘද්ධි ආධාර මිල වටිනාකම ආන්තිකව අඩු වී රුපියල් දශ ලක්ෂ 7,963 ක් විය. සමෘද්ධි වැඩසටහන සඳහා කරනු ලැබූ මුළු වියදම 1997 පැවති රුපියල් දශ ලක්ෂ 8,718 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 8,652 දක්වා අඩු විය. 1998 දී පොහොර සහනාධාරය සියයට 14 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 2,152 ක් විය. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි යූරියා පොහොර මිල 1997 දී මෙට්‍රික් ටොන් එකක් සඳහා ඇ.එ.ජ. ඩොලර් 182 සිට 1998 දී ඇ.එ.ජ. ඩොලර් 133 දක්වා අඩු වුවද, පොහොර සහනාධාර ගෙවීම් වැඩි වීම කෙරෙහි යූරියා පොහොර භාවිතය සියයට 4 කින් වැඩි වීම සහ 1997 පැවති හිඟ සහනාධාර ගෙවීම් හේතු විය. අනාථ වූවන් සඳහා කරන වියදම්, පාසැල් නිල ඇඳුම්, පාසැල් පොත්, පාසැල් වාර ප්‍රවේශ පත්‍ර සහ වෙනත් සංවර්ධන සහනාධාර ඇතුළත් කුටුම්බයනට කරනු ලබන වෙනත් සංක්‍රාම ගෙවීම් 1998 දී රුපියල් දශ ලක්ෂ 7,438 ක් විය. අනාථ වූවන් සඳහා කරන ලද ගෙවීම් රුපියල් දශ ලක්ෂ 2,117 ක් විය. පාසැල් නිල ඇඳුම් සහ පාසැල් පොත් සඳහා වියදම රුපියල් දශ ලක්ෂ 1,736 ක් විය. උතුරු සහ නැගෙනහිර පළාත්වල උන්හිටි තැන් අහිමි වූ පවුල් සඳහා වියළි ආහාර සලාක බෙදා දීම නොකඩවා සිදු කළ අතර, 1998 දී මෙවැනි පවුල් 113,558 ක් සඳහා වියළි ආහාර සලාක ලබාදීමට රුපියල් දශ ලක්ෂ 1,054 ක් වියදම් කර තිබුණි.

රාජ්‍ය සංස්ථා සහ ආයතනවලට කරනු ලැබූ වර්තන පැවරුම් 1997 දී රුපියල් දශ ලක්ෂ 5,350 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 7,287 දක්වා වැඩි විය. 1998 දී සංස්ථා සඳහා කරනු ලැබූ වර්තන පැවරුම් සියයට 10 කින් වැඩි වූ අතර, රාජ්‍ය ආයතනවලට කරනු ලැබූ වර්තන පැවරුම් සියයට 63 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 4,320 ක් විය. මෙම වර්ධනය කෙරෙහි මෙම ආයතනවල කරන ලද වැටුප් වැඩි වීම් ප්‍රධාන ලෙස හේතු විය. කෙසේ වුවද පෙරදී මහවැලි සංවර්ධන අධිකාරියෙහි ප්‍රාග්ධන වියදම් යටතේ ප්‍රතිපාදනය කල ඇතැම් වියදම් වර්තන වියදම් යටතේ ප්‍රතිවර්ගීකරණය කිරීමද මෙම වැඩි වීමට හේතු විය. මේ අතර, ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයෙහි නොගෙවූ විශ්‍රාම වැටුප්, අර්ථසාධක දායක මුදල් සහ සේවක භාරකාර මුදල් ගෙවීම සඳහා කරනු ලැබූ පැවරුම්ද ඇතුළත්ව සංස්ථාවනට කරනු ලැබූ පැවරුම් (ශ්‍රී ලංකා දුම්රිය සේවය සහ තැපැල් දෙපාර්තමේන්තුව අයත් නොවී) 1997 දී රුපියල් දශ ලක්ෂ 726 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 1,324 දක්වා වැඩි විය. ජාත්‍යන්තර වෙළෙඳපළෙහි තිරිඟු මිල 1997 පැවති වාර්ෂික සාමාන්‍ය මිල වූ ඇ.එ.ජ. ඩොලර් 175 සිට 1998 දී ඇ.එ.ජ. ඩොලර් 143 දක්වා කැපී පෙනෙන ලෙස අඩු වීම නිසා 1998 දී පිටි සහනාධාරය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට රජයට හැකි වූ අතර එමනිසා සංස්ථාවලට කරනු ලැබූ පැවරුම් වියදම් වැඩි වීම මධ්‍යස්ථ අගයක පවත්වා ගැනීමට ද හැකි විය. පළාත් පාලන ආයතනවලට කරනු ලැබූ පැවරුම් සියයට 2 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,977 ක් වූ අතර එයට වැටුප් හා වේතනවල වැඩි වීම හේතු විය.

## 8.4 සංඛ්‍යා සටහන

## කාර්යයන් අනුව වියදම්හි වර්ගීකරණය

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998 අනුමත ඇස්තමේන්තු | 1998 තාවකාලික | 1999 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | | | | | | | |
| **සාමාන්‍ය පොදු සේවා** | **30,444** | **47,888** | **53,915** | **58,926** | **56,948** | **66,158** | **58,070** |
| සිවිල් පරිපාලනය | 4,637 | 6,562 | 10,207 | 13,956 | 12,577 | 15,196 | 14,721 |
| ආරක්ෂක කටයුතු | 19,415 | 35,186 | 38,117 | 37,062 | 36,457 | 42,496 | 35,619 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 6,392 | 6,140 | 5,591 | 7,908 | 7,914 | 8,466 | 7,730 |
| **සමාජ සේවා** | **47,656** | **57,648** | **59,294** | **59,742** | **64,356** | **63,595** | **66,763** |
| අධ්‍යාපනය | 14,836 | 15,784 | 16,018 | 17,757 | 21,920 | 20,582 | 22,231 |
| සෞඛ්‍යය | 7,666 | 8,818 | 9,260 | 9,581 | 10,269 | 10,089 | 10,651 |
| සුබසාධන | 24,560 | 32,106 | 32,824 | 31,251 | 30,858 | 31,472 | 31,168 |
| ප්‍රජා සේවා | 593 | 941 | 1,191 | 1,154 | 1,309 | 1,451 | 2,713 |
| **ආර්ථික සේවා** | **6,195** | **8,078** | **8,807** | **7,418** | **10,756** | **10,547** | **9,862** |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 2,506 | 3,826 | 3,894 | 3,723 | 4,969 | 5,444 | 4,963 |
| ධීවර | 99 | 105 | 148 | 156 | 350 | 175 | 184 |
| නිෂ්පාදන සහ කැනීම් | 351 | 252 | 282 | 599 | 767 | 325 | 436 |
| බලශක්ති සහ ජල සම්පාදන | 518 | 990 | 590 | 486 | 874 | 757 | 876 |
| ප්‍රවාහන සහ සන්නිවේදනය | 2,024 | 2,014 | 2,423 | 1,674 | 2,672 | 2,934 | 2,060 |
| වෙළඳම සහ වාණිජ්‍යය | 72 | 172 | 891 | 159 | 243 | 167 | 306 |
| වෙනත් | 625 | 719 | 580 | 622 | 880 | 745 | 1,037 |
| **අනෙකුත්** | **42,789** | **40,546** | **53,132** | **58,662** | **54,332** | **59,348** | **64,811** |
| ඉන් : පොළී ගෙවීම | 38,031 | 38,687 | 48,923 | 55,246 | 55,368 | 54,897 | 59,780 |
| **ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන** | - | - | - | - | 700 | - | -300 |
| **මුළු වර්තන වියදම** | **127,084** | **154,159** | **175,149** | **184,749** | **187,091** | **199,648** | **199,206** |
| **ප්‍රාග්ධන වියදම් සහ ණයදීම්** | | | | | | | |
| **සාමාන්‍ය පොදු සේවා** | **2,390** | **5,776** | **3,161** | **3,442** | **7,527** | **6,243** | **8,149** |
| සිවිල් පරිපාලනය | 1,753 | 3,962 | 1,935 | 3,442 | 7,527 | 6,243 | 8,149 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 637 | 1,814 | 1,226 | - | - | - | - |
| **සමාජ සේවා** | **7,677** | **9,854** | **10,322** | **11,552** | **15,059** | **15,528** | **16,969** |
| අධ්‍යාපනය | 2,877 | 3,124 | 4,384 | 4,592 | 5,957 | 6,112 | 7,304 |
| සෞඛ්‍යය | 1,519 | 2,134 | 2,538 | 2,554 | 4,308 | 4,330 | 4,774 |
| සුබසාධන | 1,681 | 1,690 | 868 | 751 | 396 | 967 | 141 |
| නිවාස | 802 | 1,610 | 1,174 | 792 | 1,647 | 1,314 | 1,514 |
| ප්‍රජා සේවා | 798 | 1,297 | 1,359 | 2,863 | 2,751 | 2,804 | 3,236 |
| **ආර්ථික සේවා** | **29,304** | **36,106** | **31,409** | **32,479** | **46,633** | **44,677** | **57,526** |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 5,179 | 6,060 | 4,718 | 3,780 | 6,730 | 6,018 | 9,726 |
| මහවැලි යෝජනා ක්‍රමය | 2,598 | 3,090 | 1,940 | 1,626 | 1,265 | 1,049 | 2,127 |
| ධීවර | 368 | 361 | 311 | 480 | 773 | 562 | 876 |
| නිෂ්පාදනය හා කැනීම් | 22 | 250 | 356 | 1,442 | 2,167 | 2,191 | 836 |
| බලශක්ති සහ ජල සම්පාදන | 5,518 | 5,003 | 6,035 | 6,816 | 10,203 | 8,804 | 12,627 |
| ප්‍රවාහන හා සන්නිවේදනය | 14,522 | 18,888 | 12,636 | 12,946 | 20,536 | 18,908 | 23,013 |
| වෙළඳම සහ වාණිජ්‍යය | 182 | 20 | 105 | 182 | 909 | 230 | 394 |
| වෙනත් | 3,513 | 5,524 | 7,247 | 6,835 | 5,316 | 7,965 | 10,055 |
| **අනෙකුත්** | **1,084** | **1,074** | **1,081** | **3,787** | **1,778** | **1,829** | **4,508** |
| **ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන** | - | - | - | - | - | - | -2,595 |
| **මුළු ප්‍රාග්ධන වියදම හා ණයදීම්** | **40,455** | **52,810** | **45,973** | **51,260** | **70,998** | **68,277** | **84,556** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

දුම්රිය හා තැපැල් දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් කටයුතු වලින් සිදු වූ පාඩුව රුපියල් දශ ලක්ෂ 1,643 දක්වා වැඩි වූ අතර එම ආයතනවල වැටුප් හා වේතන වැඩි වීම සහ ගාස්තු අඩු මට්ටමක පැවතීම එයට හේතු විය. දුම්රිය ගාස්තු සියයට 25 කින් වැඩි කිරීම සඳහා 1999 අයවැය මගින් කරනු ලැබූ යෝජනාව අවසානයේදී ඉවත් කර ගැනීමට සිදු විය. කෙසේ වුවද, තැපැල් ගාස්තු 1998 දෙසැම්බර් සිට සියයට 40 කින් වැඩි කරන ලද අතර සංස්ථාවක් බවට පත් කිරීමෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ වාණිජමය ශක්‍යතාවය දියුණු කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. දුම්රිය ගාස්තු වැඩි කිරීම සහ දුම්රිය දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම කාලයක සිට කළයුතුව පැවති කටයුතු වේ.

රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල (ආරක්ෂක කටයුතු හැර) දිනපතා කරනු ලබන මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වෙනත් ගෙවීම් හා සේවා මිලදී ගැනීම් සඳහා කරනු ලැබූ වියදම් සියයට 38 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 15,930 ක් විය.

කාර්යයන් අනුව වර්ගීකරණයේදී සමාජ සේවා කටයුතු සඳහා කරනු ලැබූ වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1997 පැවති සියයට 6.7 සිට 1998 දී 6.3 දක්වා අඩු විය. සමාජ සේවා කටයුතු සඳහා කරනු ලැබූ වියදම මුළු වර්තන වියදමින් සියයට 32 ක් විය. සමාජ සේවා කටයුතු සඳහා කරනු ලැබූ මුළු වියදමින් සියයට 50 ක් පමණම අධ්‍යාපන සහ සෞඛ්‍ය කටයුතු සඳහා වැය කරන ලදී.

1998 දී ආර්ථික සේවාවන් සඳහා කරනු ලැබූ වර්තන වියදම් කැපී පෙනෙන ලෙස සියයට 42 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 10,547 ක් විය. ප්‍රවාහන සහ සන්නිවේදනය, කෘෂිකර්මය සහ වාරිමාර්ග හා බලශක්ති සහ ජල සම්පාදනය යන කටයුතු සඳහා කරනු ලැබූ වියදම්හි කැපී පෙනෙන වැඩි වීමක් පෙන්නුම් කර ඇත. 1998 දී සාමාන්‍ය පොදු සේවා සඳහා කරනු ලැබූ වියදම් සියයට 12 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 66,158 ක් විය. ආරක්ෂක කටයුතු සහ පොදු නීතිය හා ආරක්ෂාව යන කටයුතු සඳහා කරන ලද වියදම වූ රුපියල් දශ ලක්ෂ 50,960 ඉහත පොදු සේවා වියදම් වලින් සියයට 77 ක් නියෝජනය කරන ලදී.

## රාජ්‍ය ආයෝජනය

1998 දී ප්‍රාග්ධන වියදම් සහ රාජ්‍ය ව්‍යවසායයන් වෙත ණය දීම් වලින් සමන්විත රාජ්‍ය ආයෝජනය සියයට 33 ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 68,277 ක් විය. රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් මූර්ත වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම කරන ලද වියදම් සියයට 27 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 32,246 ක් විය. වාණිජමය රාජ්‍ය සංස්ථා සහ මණ්ඩලවලට කරනු ලැබූ ප්‍රාග්ධන පැවරුම් සියයට 16 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 6,801 ක් විය. මෙම පැවරුම් වලින් සියයට 75 කට වඩා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 2,390), ලංකා විදුලිබල මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 432), ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 1,552) සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 867) යන ආයතනවලට ලබා දී ඇත. මේ අතර 1998 දී වාණිජමය නොවන රාජ්‍ය ආයතනවලට කරනු ලැබූ ප්‍රාග්ධන පැවරුම් සියයට 20 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 13,285 ක් විය. මෙම ප්‍රාග්ධන පැවරුම් ලැබූ ප්‍රධාන ආයතන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 7,479), මහවැලි සංවර්ධන අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 1,049), නාගරික සංවර්ධන අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 492), උතුරු පලාත ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 996) සහ ආයෝජන මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 326) හැඳින්විය හැක.

1998 දී රාජ්‍ය ව්‍යවසායන්ට විදේශීය සම්පත් ලබාදෙන රජයේ ණය දීම් දෙගුණයක් වී රුපියල් දශ ලක්ෂ 14,117 ක් විය. 1998 අයවැය මගින් ඉලක්ක කර ගත් ණය දීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 13,658 ක් විය. ලංකා විදුලිබල මණ්ඩලය රුපියල් දශ ලක්ෂ 5,648 ක් විදුලිබල උත්පාදනය සහ බෙද හැරීමේ ව්‍යාපෘති සඳහා උපයෝගී කර ගත් අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලබා දුන් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,356 ක් විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා ටෙලිකොම් (රුපියල් දශ ලක්ෂ 2,426) හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සිදු වූ ප්‍රමාදවීම් නිසා භාවිතා කිරීමට හැකි වූයේ අයවැය ප්‍රතිපාදනයෙන් සියයට 71 ක් පමණි.

ආර්ථික සේවාවන් සඳහා කරනු ලැබූ රාජ්‍ය ආයෝජනය සියයට 38 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 44,677 ක් විය (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.4). මෙම ආයෝජනයන් විශාල ලෙස ප්‍රවාහන හා සංනිවේදනය (රුපියල් දශ ලක්ෂ 18,908), බලශක්ති සහ ජලසම්පාදනය (රුපියල් දශ ලක්ෂ 8,804) සහ කෘෂිකර්මය සහ වාරිමාර්ග (රුපියල් දශ ලක්ෂ 6,018) යන අංශයන්හි සිදු කරන ලද අතර, ඉහත කටයුතු සඳහා කරනු ලැබූ ආයෝජනය මුළු ආර්ථික සේවාවන් සඳහා කරන ලද ආයෝජනයෙන් සියයට 76 ක් විය. මහාමාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කරන ලද වියදම රුපියල් දශ ලක්ෂ 7,479 ක් වූ අතර දුම්රිය, වරාය සහ විදුලි සංදේශ කටයුතු සංවර්ධනය කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 9,239 ක් ලබා දෙන ලදී. 1998 දී ලංකා විදුලිබල මණ්ඩලය සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය මගින් බලශක්තිය සහ ජල සම්පාදනය යන අංශයන් සඳහා කරනු ලැබූ ආයෝජනයන් සියයට 29 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 8,804 ක් විය. මෙම ආයතන දෙක විසින් කරන ලද වියදම 1998 බලශක්ති සහ ජල සම්පාදන අංශයට කරන ලද මුළු ආයෝජනයෙන් සියයට 95 කට වඩා වැඩි විය. 1998 දී සමාජ සේවා කටයුතු සඳහා කරනු ලැබූ ප්‍රාග්ධන වියදම් සියයට 34 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 15,528 ක් විය. සෞඛ්‍ය (රුපියල් දශ ලක්ෂ 4,330), අධ්‍යාපනය (රුපියල් දශ ලක්ෂ 6,112), ප්‍රජාසේවා (රුපියල් දශ ලක්ෂ 2,804) සහ නිවාස

(රුපියල් දශ ලක්ෂ 1,314) යන අංශයනට කරන ලද ආයෝජනයන් සමාජ සේවා කටයුතු වෙනුවෙන් කල මුළු ආයෝජනයන්ගෙන් සියයට 90 ක් විය.

1998 රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ රුපියල් දශ ලක්ෂ 3,688 ක් වියදම් කරන ලදී. මින් විශාල ප්‍රමාණයක් මහවැලි සංවර්ධන අධිකාරියෙහි සේවකයින් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන වෙනුවෙන් වියදම් කරන ලදී. පෙරදී රාජ්‍ය ව්‍යවසායන්ට ප්‍රදානය කරන ලද ණය සඳහා රජය වෙත නැවත ලැබුන ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6,218 ක් විය. මෙම ලැබීම් වලින් සියයට 92 ක් ලංකා විදුලිබල මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 2,137), ශ්‍රී ලංකා ටෙලිකොම් (රුපියල් දශ ලක්ෂ 1,413), ජාතික සංවර්ධන බැංකුව (රුපියල් දශ ලක්ෂ 1,162), සංවර්ධන මූල්‍ය සමායතනය (රුපියල් දශ ලක්ෂ 562) සහ වරාය අධිකාරිය (රුපියල් දශ ලක්ෂ 476) යන ආයතන වලින් ලැබුණි. මේ අතර අත්තිකාරම් ගිණුම් කටයුතු යටතේ රුපියල් දශ ලක්ෂ 2,784 ක් ලබා දුන් අතර 1998 අයවැය මගින් ඇස්තමේන්තු කර තිබූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 500 ක් පමණි. රජයේ සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම සහ ඔවුන් ලබාගෙන තිබූ ණය සඳහා පොලී අනුපාතිකයන් අඩු කිරීම හේතුකොටගෙන ණය ගැනීමේ හැකියාව වැඩි වීම නිසා අත්තිකාරම් ගිණුම් තුළින් විශාල ලෙස ණය ගැනීම මෙයට හේතු විය.

## 8.5 පලාත් සභා


පලාත් සභා රැස් කර ගත් ආදායම සියයට 11 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 6,002 ක් වූ අතර, එය එම ආයතනවල සම්පත් අවශ්‍යතාවයෙන් සියයට 22 ක් සපුරාලීමට ප්‍රමාණවත් විය. පලාත් සභාවල වියදම් සියයට 14 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 26,736 ක් විය. පලාත් සභාවල සමස්ත හිඟය 1997 පැවති රුපියල් දශ ලක්ෂ 18,060 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 20,734 දක්වා වැඩි විය. මෙම හිඟය පියවීම, මධ්‍යම රජය ලබා දුන් සාමූහික ප්‍රදානයන්, උපමාන පාදක ප්‍රදාන සහ අනුරූපික ප්‍රදාන මගින් සිදු කරන ලදී.

### ආදායම

පලාත් සභාවල ප්‍රධාන ආදායම් මාර්ග වූයේ පිරිවැටුම් බදු, බලපත්‍ර ගාස්තු සහ මුද්දර බදු වේ. තොග සහ සිල්ලර වෙළෙඳාමෙහි වැඩි වීමක් පිළිබිඹු කරමින් පිරිවැටුම් බදු ආදායම් සියයට 9 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 2,980 ක් වූ අතර එය මුළු ආදායමින් සියයට 50 ක් නියෝජනය කරන ලදී. බලපත්‍ර ගාස්තු වලින් එකතු කරගත් ආදායම සියයට 13 කින් වැඩි වූ අතර ඊට ලියාපදිංචි වාහන සංඛ්‍යාවේ විශාල වැඩි වීම ප්‍රධාන ලෙස හේතු විය. දේපල පැවරීම්වල වටිනාකම වැඩි වීම පිළිබිඹු කරමින් මුද්දර බදු ආදායම සියයට 19 කින් වර්ධනය වී රුපියල් දශ ලක්ෂ 1,267 ක් විය. මුද්දර බදු ආදායම 1998 මුළු පලාත් සභා ආදායමින් සියයට 12 ක් විය. උසාවි ගාස්තු සහ අය කිරීම් ඇතුළත් මුළු විකුණුම් සහ ගාස්තු ආදායම 1998 දී සියයට 18 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 481 ක් විය.

බස්නාහිර පලාත් සභාව රැස් කල මුළු ආදායම රුපියල් දශ ලක්ෂ 3,981 ක් වූ අතර එය මුළු පලාත් සභා ආදායමින් සියයට 66 ක් විය. මේ අතර 1998 දී මධ්‍යම, දකුණ සහ වයඹ පලාත් සභා රැස් කල ආදායම් මුළු පලාත් සභාවල ආදායමින් සියයට 8 බැගින් විය.

**8.4 රූප සටහන**
**පලාත් සභාවන්හි ක්‍රියාකාරීත්වය - 1998**




### වියදම

### වර්තන වියදම

වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 25,230 ක් වූ අතර එය 1997 දී මෙන්ම මුළු වියදමින් සියයට 94 ක් විය. 1997 පැවති සියයට 6 ක වැඩි වීම හා සසඳන කළ වර්තන වියදම සියයට 14 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ වැටුප් හා වේතන වියදම් සියයට 16 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 19,744 ක් වීමයි. 1997 යෝජනා කරන ලද වැටුප් වැඩි වීමේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම මෙම වැටුප් වියදම වැඩි වීමට ප්‍රධාන ලෙස හේතු විය. කාර්යයන් අනුව සැලකීමේදී අධ්‍යාපන (රුපියල් දශ ලක්ෂ 13,507), සෞඛ්‍ය (රුපියල් දශ ලක්ෂ 13,507) සහ ප්‍රාදේශීය පරිපාලනය (රුපියල් දශ ලක්ෂ 651) සඳහා 1998 මුළු වැටුප් හා වේතන වලින් සියයට 92 ක් වැය විය. අනෙකුත් වර්තන වියදම් වන ප්‍රවාහන, සැපයුම්, ගිවිසුම් සේවා, සංක්‍රාම ගෙවීම් ආදියෙහි අඩු වීමක් පෙන්නුම් කරන ලද අතර, පසුගිය වර්ෂයේදී මෙම වියදම් සියයට 6 කින් වැඩි විය.

අධ්‍යාපන, සෞඛ්‍ය සහ අනෙකුත් සමාජ සේවා කටයුතු ඇතුළත් වූ සමාජ සේවා වියදම් සියයට 16 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 21,787 ක් වූ අතර එය මුළු වර්තන වියදම් වලින් සියයට 86 ක් විය. මේ අතර පලාත් සභාවල පොදු සේවා සහ ආර්ථික සේවා කටයුතු සඳහා වියදම් පිළිවෙලින් සියයට 22 කින් සහ සියයට 14 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 2,377 සහ රුපියල් දශ ලක්ෂ 1,067 ක් විය.

**8.5 සංඛ්‍යා සටහන**

**පළාත් සභාවල අයවැය තත්ත්වය**

රුපියල් දශලක්ෂ

| | 1995 | 1996 | 1997 | 1998(අ) |
|---|---|---|---|---|
| **1. මුළු ආදායම** | **4,440** | **4,884** | **5,395** | **6,002** |
| 1.1 නිෂ්පාදනය සහ වියදම මත බදු | 3,181 | 3,416 | 3,744 | 4,114 |
| පිරිවැටුම් බදු | 2,335 | 2,464 | 2.734 | 2,980 |
| බලපත්‍ර ගාස්තු | 840 | 946 | 1,000 | 1,127 |
| වෙනත් බදු | 6 | 6 | 10 | 8 |
| 1.2 ලාභ සහ ලාභාංශ | 68 | 67 | 175 | 129 |
| 1.3 විකුණුම් හා ගාස්තු | 317 | 355 | 408 | 481 |
| 1.4 මුද්දර බදු | 867 | 1,036 | 1,051 | 1267 |
| 1.5 වෙනත් | 7 | 10 | 17 | 11 |
| **2. මුළු වියදම** | **20,852** | **22,128** | **23,455** | **26,736** |
| 2.1 වර්තන වියදම් | 19,795 | 20,941 | 22,055 | 25,230 |
| කාර්යයන් අනුව වර්ගීකරණය | 19,795 | 20,941 | 22,055 | 25,230 |
| පළාත් පරිපාලනය | 2,067 | 1,942 | 1,941 | 2,377 |
| ආර්ථික සේවා | 755 | 834 | 939 | 1067 |
| සමාජ සේවා | 16,973 | 18,166 | 19,175 | 21,787 |
| ආර්ථික වර්ගීකරණය | 19,795 | 20,941 | 22,055 | 25,230 |
| වැටුප් හා වේතන | 16,031 | 16,263 | 17,067 | 19,744 |
| වෙනත් | 3,765 | 4,679 | 4,988 | 5486 |
| 2.2 ප්‍රාග්ධන වියදම් | 1.057 | 1,187 | 1,400 | 1,507 |
| ප්‍රාග්ධන භාණ්ඩ අත්පත් කර ගැනීම | 594 | 757 | 729 | 773 |
| ප්‍රාග්ධන පැවරුම් | 66 | 53 | 55 | 75 |
| වෙනත් | 397 | 377 | 616 | 658 |
| **3. පියවීම** | **15,288** | **16,873** | **18,348** | **20,594** |
| 3.1 සාමූහික ප්‍රදාන | 14,066 | 15,831 | 16,855 | 19,194 |
| 3.2 උපමාන පාදක ප්‍රදාන | 897 | 800 | 1,168 | 1,163 |
| 3.3 අනුරූපිත ප්‍රදාන | 325 | 242 | 325 | 237 |

මූලයන් : පළාත් සභා සහ පළාත්පාලන අමාත්‍යාංශය

(අ) තාවකාලික

1998 දී බස්නාහිර පළාත් සභාවේ වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 5,687 ක් වූ අතර එය පළාත් සභාවල මුළු වර්තන වියදමින් විශාලම කොටස වූ සියයට 23 ක් විය. මේ අතර, දෙවන විශාල කොටස වූ මධ්‍යම පළාතේ වර්තන වියදම් මුළු පළාත් සභා වර්තන වියදම් වලින් සියයට 14 ක් වූ අතර, අනිකුත් සියළුම පළාත් සභා මුළු වර්තන වියදමට සියයට 11 බැගින් දායක විය.

## ප්‍රාග්ධන වියදම්

පළාත් සභාවල ප්‍රාග්ධන වියදම් 1998 දී මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරන ලදී. උපකරණ, වියදම්, ඉඩම් සහ ගොඩනැගිලි වැඩි දියුණුකිරීමේ වියදම්, ප්‍රාග්ධන සංක්‍රාම හා සහනාධාර සහ ප්‍රාග්ධන උපකරණ, නඩත්තුව යන කටයුතු ඇතුළත් මුළු ප්‍රාග්ධන වියදම් සියයට 8 කින් ඉහළ ගොස් රුපියල් දශ ලක්ෂ 1,507 ක් වූ අතර, සැසඳීමේදී පසුගිය වර්ෂයේ ඉහත වැඩි වීම සියයට 18 ක් විය. මෙම මන්දගාමී වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ සම්පත් හිඟ බවයි. මධ්‍යකාලීන ආයෝජන වැඩසටහන යටතේ අදාළ අමාත්‍යාංශ විසින් ලබා දෙනු ලැබූ මූල්‍ය පහසුකම් යටතේ විවිධ ප්‍රාග්ධන වියදම් වැඩසටහන් පළාත් සභාවලට පවරා දෙන ලදී.

## මධ්‍යම රජයේ සංක්‍රාම ගෙවීම්

1998 වර්ෂයේ පළාත් සභාවල සමස්ත හිඟය රුපියල් දශ ලක්ෂ 20,734 ක් වූ අතර එය 1997 හිඟය වූ රුපියල් දශ ලක්ෂ 18,060 සමග සැසඳිය හැක. 1998 පළාත් සභාවල වර්තන වියදම් සඳහා රුපියල් දශ ලක්ෂ 19,194 ක් සාමූහික ප්‍රදානයන් ලෙස මධ්‍යම රජයෙන් ලබා දෙන ලදී. එය මධ්‍යම රජය ලබා දුන් මුළු ප්‍රදානයන්ගෙන් සියයට 95 ක් විය. මේ අතර ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන උපමාන පාදක ප්‍රදාන සහ අනුරූපික ප්‍රදාන යටතේ ලබා දුන් අතර එය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,163 සහ රුපියල් දශ ලක්ෂ 237 ක් විය.

## 8.6 රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ

සීමාසහිත එයාර් ලංකා, වැවිලි සමාගම් සහ සීමාසහිත ඔරියන්ට් ලංකා වැනි ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්හි කොටස් පුද්ගලීකරණය කරමින් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන 1998 දීත් නොකඩවා ක්‍රියාත්මක විය. කෙසේ වුවද, පුද්ගලීකරණ කටයුතුවල එක්තරා මන්දගාමී බවක් දක්නට ලැබුණු අතර ඊට ලෝක ආර්ථික තත්ත්වයෙහි පැවති අවිනිශ්චිත බව සහ දේශීය කොටස් වෙළෙඳපොළෙහි පැවති දුර්වල තත්ත්වය හේතු විය. 1998 අයවැය මගින් ඉලක්ක කර ගත් ආදායම වූ රුපියල් දශ ලක්ෂ 8,000 සමග සසඳන විට කොටස් අලෙවිය මගින් රජය ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 4,387 ක් විය.

1998 දී අවසන් කරන ලද තනි විශාලතම පුද්ගලීකරණ ගනුදෙනුව වූයේ වසර 10 ක කළමනාකරණ ගිවිසුමකට එළඹෙමින් සීමාසහිත එයාර් ලංකා හි කොටස් සියයට 40 ක් පවරා දීමයි. සියයට 40 කොටස් පවරා දීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 70 ක මුදල් අර්පනයක් රජයට ලැබුණු අතර, 1998 දී සියයට 26 ක කොටස් විකිණීමෙන් ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 45 (රුපියල් දශ ලක්ෂ 2,816) ක් ලැබුණි. ඉතිරි කොටස් සියයට 14 සඳහා වූ ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 25 වසර 2000 දෙසැම්බර් මස අවසානයට පෙර ගෙවීම කළයුතු වේ. එයාර් ලංකා ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ අහස්යානා මිලට ගැනීමේ වැඩසටහන යටතේ ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 600 ක් එයාර් ලංකා හි අහස්යානා නවීකරණය කිරීමට 1999 සහ 2000 හිදී ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. මෙම ආයෝජන සඳහා අවශ්‍ය සම්පත් විදේශ මූලාශ්‍රයන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

වැවිලි සමාගම් පහක එනම්, මඩුල්සීම වැවිලි සමාගම, හපුගස්තැන්න වැවිලි සමාගම, බලංගොඩ වැවිලි සමාගම, උඩපුස්සැල්ලෑව වැවිලි සමාගම සහ මල්වත්ත වැවිලි සමාගම්හි කොටස් වලින් සියයට 20 බැගින් කොටස්, පොදු කොටස් නිකුතුවක් මගින් අලෙවි කරන ලද අතර එමගින් 1998 දී ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 232 ක් විය. වටවල වැවිලි සමාගම, මස්කෙලිය වැවිලි සමාගම සහ බලංගොඩ වැවිලි සමාගම යන වැවිලි සමාගම් තුනෙහි රජය සතුව පැවති සියයට 19 ක කොටස් කොළඹ කොටස්

**8.6 සංඛ්‍යා සටහන**

**පෞද්ගලීකරණ ලැබීම් 1998 (අ)**

| ව්‍යවසායයේ නම | වැඩි කොටස් අයිතිය විකිණීම | | | පොදු කොටස් නිකුතුව | | ලැබුණු මුළු මුදල රු.දශලක්ෂ |
|---|---|---|---|---|---|---|
| | පවරාදීම් % | දේශීය රු.දශලක්ෂ | විදේශීය රු.දශලක්ෂ | පවරාදීම් % | ලැබුණු ප්‍රමාණය රු.දශලක්ෂ | |
| **වැවිලි සමාගම්** | | | | | | |
| වටවල වැවිලි සමාගම | | | | 19 | 231.80 | 231.80 |
| මස්කෙළිය වැවිලි සමාගම | | | | 19 | 171.00 | 171.00 |
| මඩුල්සිම වැවිලි සමාගම | | | | 20 | 60.00 | 60.00 |
| හපුගස්තැන්න වැවිලි සමාගම | | | | 20 | 40.00 | 40.00 |
| බලංගොඩ වැවිලි සමාගම | | | | 39 | 233.90 | 233.90 |
| උඩුපුස්සැල්ලැව වැවිලි සමාගම | | | | 20 | 19.00 | 19.00 |
| කහවත්ත වැවිලි සමාගම | | | | 20 | 33.00 | 33.00 |
| **වෙනත් ව්‍යවසායයන්** | | | | | | |
| කොළඹ කොමර්ෂල් (ඉංජිනේරු) සමාගම | 90 | 38.50 | | | | 38.50 |
| එයාර් ලංකා සමාගම | 26 | | 2816.16 | | | 2816.16 |
| ඔරියන්ට් ලංකා සමාගම | 37 | | 740.00 | | | 740.00 |
| හිඟුරක්ගොඩ බීජ වී ගොවිපළ | | | | | | 3.88 |
| එකතුව | | 38.50 | 3556.16 | | 788.70 | 4387.24 |

මූලය : රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම

(අ) කොළඹ කොටස් වෙළඳපොළට කොමිස් සහ අනෙකුත් ගාස්තු ගෙවීමෙන් පසුව, පවරාදෙනු ලැබීම්වල ශුද්ධ ප්‍රමාණයන් රජයේ ගිණුම්වල පෙන්නුම් කෙරේ. සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරෙන්නේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම මගින් සිදු වූ ලැබීම් පමණි. මීට අමතරව මෙම වාරික ගෙවීම් සෘජුවම මහා භාණ්ඩාගාරය වෙත ලැබී ඇත.

වෙළෙඳපොළෙහි වැඩිම ඉල්ලුම්කරුවනට විකුණන ලද අතර එමගින් 1998 දී ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 557 ක් විය. කෙසේ වුවද, 1998 සඳහා වැවිලි සමාගම් ප්‍රතිසංස්කරණය යටතේ ඉලක්ක කරන ලද වැඩසටහන වර්ෂය තුළදී සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර ඊට කොටස් වෙළෙඳපොළෙහි පැවති දුර්වල තත්ත්වය හේතු විය. වැවිලි සමාගම් 21 න් සමාගම් 13 ක් සිය නිකුතු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 20 ක කොටස් ජනතාව වෙත නිකුත් කිරීම මගින් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත වී ඇත. මෙම වැවිලි සමාගම් 13 හි වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් දශ ලක්ෂ 5,061 ක් වූ අතර එය 1998 කොටස් වෙළෙඳපොළෙහි මුළු ප්‍රාග්ධනීකරණ ප්‍රමාණයෙන් සියයට 4 කට දයක විය. 1995 අවසාන භාගයේදී ආරම්භ කරන ලද වැවිලි සමාගම් පවරා දීමේ වැඩසටහන මගින් මේ දක්වා රජයට ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 6,500 ක් විය.

පෞද්ගලීකරණයෙන් පසු කර අසාර්ථකත්වයට පත්ව පසුව රජය අත්පත් කරගත් රාජ්‍ය ව්‍යවසායයන් නැවත පෞද්ගලික අංශයට පවරා දීම 1998 දීද අඛණ්ඩව කරගෙන යනු ලැබිණ. 1993 දී සීමාසහිත කාර්ගෝ බෝට් ඩිස්පැච් සමාගමට කොටස් වලින් සියයට 60 ක් පවරා දෙන ලද සීමාසහිත කලම්බු කොමර්ෂල් සමාගම (ඉංජිනේරු) 1995 දී නැවත අසාර්ථකත්වයට පත් පුද්ගලීකරණය කළ රාජ්‍ය ව්‍යවසායක් ලෙස රජය විසින් අත්පත් කර ගන්නා ලද අතර, නැවත එහි කොටස් වලින් සියයට 90 ක් අලෙවි කර එය සීමාසහිත සෙරන්ඩිබ් ඉන්ජිනියරින් ඒජන්සි වෙත පවරා දෙනු ලැබිණ. එමගින් රුපියල් දශ ලක්ෂ 38 ක ආදායමක් 1998 දී රජයට ලැබුණි. සීමාසහිත ලංකා ලෝහ හාඩ්වෙයාර්හි මුළු කොටස් ප්‍රමාණයම, සීමාසහිත සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් සහ කන්ස්ට්‍රක්ෂන් සමාගමට විකුණන ලදී. කෙසේ වුවද මෙම ගණුදෙනුව වෙතින් රජයට කිසිම ආදායමක් නොලැබුණ අතර ඊට හේතුව වූයේ එම ව්‍යාපාරයේ මුළු වගකීම් එම ව්‍යාපාරයේ මුළු වත්කම්වලට වඩා වැඩි වීමයි.

1998 අයවැය මගින් වානිජමය බීජ වී නිෂ්පාදනය දියුණු කිරීම සඳහා තෝරා ගත් රජයේ බීජ ගොවිපලවල් පුද්ගලික අංශයට දිගුකාලීන බදු යටතේ ලබා දීමට යෝජනා කරන ලදී. මේ යටතේ හිඟුරක්ගොඩ බීජ වී ගොවිපල සීමාසහිත සීඅයිසී පොහොර (පෞද්ගලික) සමාගමට බදු දෙන ලද අතර එමගින් 1998 දී රජයට රුපියල් දශ ලක්ෂ 3.88 ක ආදායමක් ලැබුණි (ඉන් රුපියල් දශ ලක්ෂ 3 ක් වංචල දේපල සඳහාද ඉතිරිය නිශ්චල දේපල හා දිගුකාලීන බදු සඳහා ගෙවන ලදී).

## 8.7 අයවැය හිඟය පියවීම


1998 අයවැය හිඟය (ප්‍රදානයන්ට සහ පුද්ගලීකරණ ලැබීම්වලට පෙර) රුපියල් දශ ලක්ෂ 93,147 ක් වූ අතර, 1997 දී එය රුපියල් දශ ලක්ෂ 70,061 ක් විය. 1998 අයවැය හිඟයෙහි දළ විදේශීය ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 28,548 ක් වූ අතර එය 1997 වර්ෂයට වඩා සියයට 23 ක වැඩි වීමකි. කෙසේ වුවද විදේශීය ණය ආපසු

ගෙවීම් රුපියල් දශ ලක්ෂ 18,351 ක් වූ හෙයින් වර්ෂය තුළ ශුද්ධ විදේශීය ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 10,197 ක් විය. ශුද්ධ දේශීය මූල්‍යකරණය 1998 දී රුපියල් දශ ලක්ෂ 41,087 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 71,362 ක් වූ අතර එය පසුගිය වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 19,480 ක පහත වැටීම සමඟ සැසඳිය හැක. ඒ අනුව ශුද්ධ දේශීය මූල්‍යකරණය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් සේ ගත් කල 1997 දී සියයට 3.4 සිට 1998 දී සියයට 7 දක්වා කැපී පෙනෙන වැඩි වීමක් පෙන්නුම් කළේය. ශුද්ධ ණය ගැනීම්, දේශීය මූලාශ්‍රයන් වූ බැංකු නොවන අංශයෙන් රුපියල් දශ ලක්ෂ 52,408 ක් සහ බැංකු අංශයෙන් ලබා ගත් රුපියල් දශ ලක්ෂ 18,954 කින්ද සමන්විත විය. 1997 දී බැංකු ක්ෂේත්‍රයට කල රුපියල් දශ ලක්ෂ 2,171 ක ගෙවීම සමඟ සැසඳීමේදී මෙය කැපී පෙනෙන වෙනසකි.

1998 දී දේශීය මූලාශ්‍රයන්ගෙන් ලබා ගත් දළ ණය ප්‍රමාණයෙහි එකතුව රුපියල් දශ ලක්ෂ 113,908 ක් විය. 1998 දී බැංකු නොවන දේශීය මූලාශ්‍ර වලින් ලබා ගත් දළ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 94,954 කි. එය 1997 හා සසඳනවිට රුපියල් දශ ලක්ෂ 57,048 ක් විය. 1998 දී රුපියල් ණය, භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් වැනි ප්‍රධාන ණය උපකරණ මඟින් බැංකු නොවන දේශීය මූලාශ්‍ර වලින් ණය ගැනීම කරන ලදී. 1997 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 8,224 හා සසඳනවිට මධ්‍යකාලීන වෙළෙඳ-පොළ ණය වශයෙන් 1998 දී රුපියල් දශ ලක්ෂ 34,509 ක් භාණ්ඩාගාර බැඳුම්කර මඟින් ලබා ගන්නා ලදී. කල් පිරීමේ කාලය අනුව අවුරුදු 2, 3 සහ 4 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කරවල කූපන් පොලී අනුපාතයන් පිළිවෙලින් සියයට 11.0, 11.5 සහ 12.0 වශයෙන් ස්ථිරව පැවතුණද, මෙම සුරැකුම්වල බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකයන් පිළිවෙලින් සියයට 10.81-13.94, සියයට 12.44-13.93 සහ සියයට 12.93-13.94 වශයෙන් පරාසගතව පැවතුණි. 1998 දී කූපන් පොලී අනුපාතිකයෙහි සහ බර තැබූ පොලී අනුපාතිකයෙහි වූ සැලකිය යුතු වෙනස නිසා රුපියල් දශ ලක්ෂ 1,156 ක මූල්‍ය හිඟයක් ඇති විය. 1998 දී භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රධාන ආයෝජකයන් වූයේ ආයතනික ආයෝජකයින් වන අතර ඒ යටතේ සේවක අර්ථසාධක අරමුදල රුපියල් දශ ලක්ෂ 8,812 සහ ඉතිරි කිරීමේ ආයතන රුපියල් දශ ලක්ෂ 8,763 ක් වශයෙන් ආයෝජනය කරන ලදී. භාණ්ඩාගාර බැඳුම්කරවල ඉහළ ගිය ජනප්‍රිය භාවය පෙන්නුම් කරමින් 1998 දී බැංකු නොවන පෞද්ගලික ආයෝජකයින් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා කල ආයෝ-ජනය රුපියල් දශ ලක්ෂ 17,320 ක් දක්වා වර්ධනය වූ අතර 1997 දී එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 3,503 ක් විය.

1998 දී රුපියල් ණය මඟින් ලබා ගත් මුළු දළ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 52,300 ක් විය. කෙසේ වෙතත්, රුපියල් දශ ලක්ෂ 16,000 ක රුපියල් ණය කලින් ගෙවා නිදහස් කිරීමක්ද ඇතුළත්ව රුපියල් ණය ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 41,231 ක් වූ අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස අදල වර්ෂය තුළ ශුද්ධ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 11,069 ක් විය. 1997 දී රුපියල් ණය මඟින් ශුද්ධ

**8.5 රූප සටහන**
**හිඟය පියවීම - 1998**




ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 33,500 ක් විය. වර්ෂය තුළදී අයවැය මඟින් රුපියල් ණයවල පොලී ප්‍රතිශතයන් මත ඇති වූ පීඩනයෙහි බලපෑම පිළිබිඹු කරමින් රුපියල් ණය පොලී අනුපාතිකය වර්ෂය මුලදී පැවති සියයට 11.00 -11.25 සිට වර්ෂය අවසාන කාලය තුළදී සියයට 12.00-12.25 දක්වා වැඩි විය. පසුගිය වර්ෂයේ මෙන්ම 1998 වර්ෂයේදීද රුපියල් ණය වැඩසටහනේ ප්‍රධාන දයකයා වූයේ රුපියල් දශ ලක්ෂ 38,672 ක දළ ආයෝජනයක් කල සේවක අර්ථසාධක අරමුදලය. ජාතික ඉතිරි කිරීමේ බැංකුව රුපියල් දශ ලක්ෂ 9,528 ක්ද, ඉතිරිය වූ රුපියල් දශ ලක්ෂ 4,100 ක් අනෙකුත් ආයතනික ආයෝජකයන් විසින්ද ආයෝජනය කර ඇත.

1998 දී භාණ්ඩාගාර බිල්පත් නව නිකුතු මඟින් රුපියල් දශ ලක්ෂ 7,000 ක සම්පත් රැස් කර ගන්නා ලදී. කෙසේ වෙතත් වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශ ලක්ෂ 2,000 ක් ගෙවා නිදහස් කරන ලද අතර මේ නිසා 1998 දී ශුද්ධ නිකුතුව රුපියල් දශ ලක්ෂ 5,000 ක් විය. ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනු සඳහා ගැලපුම් කළ පසු, ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,016 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 8,238 ක් විය. මීට අතිරේකව වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1997 දී පැවති රුපියල් දශ ලක්ෂ 20,490 සිට රුපියල් දශ ලක්ෂ 6,938 කින් අඩු වී 1998 දී රුපියල් දශ ලක්ෂ 13,552 ක් විය. එසේම බැංකු අංශය සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1997 දී සියයට 33 සිට 1998 දී සියයට 20 දක්වා අඩු වූ අතර, පසුගිය වර්ෂ දෙක තුළ බැංකු නොවන අංශය සතු ප්‍රමාණය සියයට 67 සිට සියයට 80 දක්වා වැඩි විය.

1998 පැවති විශාල සම්පත් පරතරය හේතුකොටගෙන අයවැය හිඟය පියවීම සඳහා රජයට බැංකු වලින් ණය ලබා ගැනීමට සිදු විය. මේ අනුව, 1998 දී බැංකු වලින් ලබා ගන්නා ලද මුළු ශුද්ධ දේශීය ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 18,954 ක් (විදේශ ව්‍යවහාර මුදල් ඒකකයන් මඟින් ලබා ගත් ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 සහිතව)

විය. මූල්‍ය අයිතම එකතුවීමේ ක්‍රියාදාමය රුපියල් දශ ලක්ෂ 660 කින් අඩු වුවද තාවකාලික අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 1,885 කින් වර්ධනය වීම භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශ ලක්ෂ 1,016 කින් වැඩි වීම සහ රජයේ තැන්පතු ශේෂයන් රුපියල් දශ ලක්ෂ 3,368 කින් පහළ යාම යන කරුණුවල ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවෙන් ශුද්ධ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 5,609 ක් වූ අතර එය 1998 දී ආර්ථිකයේ සංචිත මුදල්වල ප්‍රසාරනයට දායක විය.


1998 දී වානිජ බැංකු වලින් රජය ලබා ගත් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 13,345 ක් වූ අතර, ආනයන බිල්වල භාවිතය වැඩි වීම (රුපියල් දශ ලක්ෂ 9,892), වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බැඳුම්කර අයිතිය වැඩි වීම (රුපියල් දශ ලක්ෂ 3,232) සහ වානිජ බැංකුවල රජයේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 2,083 කින් අඩු වීම යන කරුණු ඊට හේතු විය.

1998 දී දළ විදේශීය ණය ගැනීම් සියයට 23 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 28,548 ක් වූ අතර, එය 1998 අයවැයෙන් අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 91 කි. ශුද්ධ වශයෙන් 1998 දී අයවැය හිඟය පියවීම සඳහා ලැබූ විදේශීය සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10,196 ක් වූ අතර, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.0 කි. එමඟින් 1998 අයවැය හිඟයෙන් සියයට 12 ක් පමණක් පියවා ගත හැකි විය. ඉහළ මට්ටමක පැවති ණය දීම් අයවැයෙන් අපේක්ෂා කළ පරිදි රාජ්‍ය ආයෝජනයන්හි සීඝ්‍ර වර්ධනය ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය දේශීය අරමුදල් ලබා දීම, විදේශීය සම්පත් උපයෝජනය ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් බලපෑ හේතු ලෙස සැලකිය හැක.

## 8.8 රාජ්‍ය ණය

1998 වසර අවසාන වනවිට රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 907,426 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එය 1997 පැවැති සියයට 86 සිට සියයට 89.4 දක්වා වැඩි විය. මෙහි 1993 දී සහ 1996 දී රාජ්‍ය බැංකු දෙක සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නිකුත් කල රුපියල් දශ ලක්ෂ 47,961 ක් වූ දිගුකාලීන බැඳුම්කරද ඇතුළත්ය. මෙම දිගුකාලීන බැඳුම්කර හැර නොපියවූ මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 859,465 ක් වූ අතර එය සියයට 21 ක වැඩි වීමක් වාර්තා කළේය. ප්‍රතිව්‍යුහගත බැඳුම්කර හැර දේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 398,586 ක් වූ අතර එය මුළු දේශීය ණය ප්‍රමාණයෙන් සියයට 46 කි. 1997 දී එය සියයට 47 ක් විය. මුළු දේශීය ණය වලින් කෙටිකාලීන ණය රුපියල් දශ ලක්ෂ 146,961 ක් වූ අතර මධ්‍යකාලීන සහ දිගුකාලීන ණය රුපියල් දශ ලක්ෂ 251,625 ක් විය. මේ අනුව, කෙටිකාලීන ණය 1997 දී පැවති සියයට 40 සිට 1998 දී සියයට 37 දක්වා අඩු වූ අතර දිගුකාලීන ණය සියයට 60 සිට සියයට 63 දක්වා වැඩි විය. 1998 වර්ෂය තුළදී නොපියවූ විදේශීය ණය ප්‍රමාණය සියයට 20 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 460,879 ක් විය.

**8.6 රූප සටහන**
**රාජ්‍ය ණය සංයුතිය**




### දේශීය ණය

1998 වර්ෂය තුළදී දේශීය ණය ප්‍රමාණය (ප්‍රතිව්‍යුහගත බැඳුම්කර හැර) සියයට 19 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 398,586 ක් විය. මෙයට මධ්‍යකාලීන හා දිගුකාලීන රුපියල් සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 202,609 ක්ද, භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් දශ ලක්ෂ 48,915 ක්ද, භාණ්ඩාගාර තැන්පතු සහතිකපත් රුපියල් දශ ලක්ෂ 12 ක්ද අයත් විය. 1998 දී රුපියල් සුරැකුම්පත් වලින් ලබා ගත් ණය ප්‍රමාණය ප්‍රතිව්‍යුහගත බැඳුම්කර රහිතව රුපියල් දශ ලක්ෂ 202,609 ක් වූ අතර එය 1997 වර්ෂයට වඩා සියයට 6 ක වැඩි වීමකි. පෙර වර්ෂයේදී එම වැඩි වීම සියයට 21 ක් විය. වර්ෂ 4-10 දක්වා වූ දිගුකාලීන කල්පිරීමේ කාලයන් සහිතව නිකුත් කල රුපියල් ණය සඳහා පොලී ප්‍රතිශතය සියයට 11-12.25 ක් වූ අතර වර්ෂ 2-8 දක්වා වූ කල්පිරීමේ කාලසීමාවන් සහිතව 1997 දී නිකුත් කල රුපියල් ණය සඳහා වූ පොලිය 11.25-14.5 ක් විය. සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව රුපියල් ණය වැඩසටහනේ ප්‍රධාන දායකයන් ලෙස තවදුරටත් ක්‍රියා කරන ලදී.

1998 දී රාජ්‍ය ණයෙහි වෙළෙඳපළ නැඹියාවෙහි ප්‍රගතියක් පෙන්නුම් කරමින් නොපියවූ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 48,915 ක් දක්වා වැඩි විය. භාණ්ඩාගාර බැඳුම්කර, මුළු මැදි හා දිගුකාලීන ණය වලින් 1997 දී පැවති සියයට 5 සිට 1998 දී සියයට 19 දක්වා වර්ධනය විය. 1997 දී සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රධාන දායකයන් වූ අතර, 1998 දී බැංකු නොවන ආයෝජකයන් එහි වැඩි දායකත්වයක් දැරීය. වාණිජ බැංකුවලට භාණ්ඩගාර බැඳුම්කර ද්‍රවශීල වත්කමක් ලෙස සැලකීම සඳහා අවසර ලබා දීමත්, මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගණුදෙනු සඳහා පිළි ගැනීමක් නිසා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වාණිජ බැංකුවල ඉල්ලුම වැඩි විය.

## 8.7 සංඛ්‍යා සටහන
## නොපිය වූ රාජ්‍ය ණය (වර්ෂය අවසානයට)

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998 තාවකාලික රු.දශලක්ෂ |
|---|---|---|---|---|---|
| **මුළු දේශීය ණය (අ)** | **249,119** | **285,759** | **349,007** | **382,962** | **446,547** |
| කෙටිකාලීන | 108,725 | 127,470 | 142,689 | 133,303 | 146,961 |
| මැදි හා දිගුකාලීන | 140,394 | 158,289 | 206,318 | 249,659 | 299,586 |
| ණය උපකරණ අනුව | 249,119 | 285,759 | 349,007 | 382,962 | 446,547 |
| රුපියල් සුරැකුම්පත් | 137,554 | 157,928 | 205,975 | 239,475 | 250,570 |
| භාණ්ඩාගාර බිල්පත් | 98,896 | 113,771 | 124,996 | 114,996 | 119,996 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | - | - | 10,000 | 48,915 |
| වෙනත් | 12,669 | 14,060 | 18,036 | 18,491 | 27,066 |
| ආයතන අනුව | 249,119 | 285,759 | 349,007 | 382,962 | 446,547 |
| බැංකු | 100,043 | 113,355 | 103,553 | 101,966 | 100,903 |
| මහබැංකුව | 21,345 | 28,684 | 34,807 | 24,999 | 29,150 |
| වාණිජ බැංකු (ආ) | 78,698 | 84,671 | 68,746 | 76,967 | 71,753 |
| තිදන් අරමුදල් | 137 | 100 | 100 | 100 | 100 |
| බැංකු නොවන | 148,939 | 172,304 | 245,354 | 280,896 | 345,544 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 46,407 | 48,406 | 47,794 | 62,498 | 67,260 |
| සේවක අර්ථසාධක අරමුදල | 79,745 | 95,000 | 113,236 | 134,867 | 157,711 |
| වෙනත් | 22,786 | 28,898 | 84,324 | 83,531 | 120,573 |
| **මුළු විදේශීය ණය** | **301,812** | **346,286** | **359,390** | **383,116** | **460,879** |
| ව්‍යාපෘති ණය | 246,075 | 286,848 | 302,666 | 321,122 | 399,890 |
| ව්‍යාපෘති නොවන ණය | 55,737 | 59,438 | 56,724 | 61,994 | 60,989 |
| ආයතන අනුව | 301,812 | 346,286 | 359,390 | 383,116 | 460,879 |
| සහනදායී ණය | 293,556 | 336795 | 350,024 | 362,435 | 445,938 |
| සහනදායී නොවන ණය | 8,256 | 9,491 | 9,366 | 20,681 | 14,941 |
| ව්‍යවහාර මුදල් අනුව | 301,812 | 346,286 | 359,390 | 383,116 | 460,879 |
| විගැහි | 95,340 | 115,537 | 130,818 | 142,733 | 172,375 |
| එක්සත් ජනපද ඩොලර් | 67,546 | 72,488 | 74,623 | 89,896 | 89,757 |
| යෙන් | 89,291 | 101,537 | 99,868 | 98,738 | 139,548 |
| ඩොයිෂ් මාර්ක් | 25,009 | 29,114 | 27,313 | 25,746 | 29,432 |
| වෙනත් | 24,626 | 27,610 | 26,768 | 26,003 | 29,767 |
| විදේශීය සැපයුම්කරුවන්ගේ ණය | 950 | 1,020 | 923 | 499 | 575 |
| **නොපිය වූ මුළු රාජ්‍ය ණය** | **550,931** | **632,045** | **708,397** | **766,078** | **907,426** |
| **තිදන් අරමුදල් අත්හළ පසුව නොපිය වූ මුළු රාජ්‍ය ණය** | **550,794** | **631,945** | **708,297** | **765,978** | **907,326** |
| සටහන : රාජ්‍ය ණය/ද.දේ.නි. (%) | | | | | |
| දේශීය ණය | 43.0 | 42.8 | 45.4 | 43.0 | 44.0 |
| විදේශීය ණය | 52.1 | 51.9 | 46.8 | 43.0 | 45.4 |
| මුළු රාජ්‍ය ණය | 95.1 | 94.6 | 92.2 | 86.0 | 89.4 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1993 දී සහ 1996 දී නිකුත් කරන ලද රු. දශලක්ෂ 24,088 සහ රුපියල් දශලක්ෂ 23,873 ක් වූ දිගුකාලීන බැඳුම්කර ඇතුළත්ය.

(ආ) විදේශ ව්‍යවහාර මුදල් ඒකකයන්ගෙන් (FCBUs) ලබාගත් රුපියල් දශලක්ෂ 6,773 (එ.ජ.ඩොලර් දශලක්ෂ 100) ඇතුළත්ය.

භාණ්ඩාගාර තැන්පතු සහතික මත නොපියවූ ණය ප්‍රමාණය 1997 හා සැසඳීමේදී රුපියල් දශ ලක්ෂ 83 සිට 1998 වනවිට රුපියල් දශ ලක්ෂ 12 දක්වා අඩු විය.

කෙටිකාලීන ණය වූ භාණ්ඩාගාර බිල්පත්, තාවකාලික අත්තිකාරම්, සහ විදේශ ව්‍යවහාර මුදල් ඒකකයන්ගෙන් ගත් ණය (FCBUs) 1997 වර්ෂය අවසානයේදී පැවැති රුපියල් දශ ලක්ෂ 133,303 සිට 1998 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 146,961 දක්වා වැඩි විය. 1998 දී රුපියල් දශ ලක්ෂ 5,000 ක නව නිකුතුව නිසා භාණ්ඩාගාර බිල්පත්වල මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 119,996 දක්වා වැඩි විය. කෙටිකාලීන ණය වූ තාවකාලික අත්තිකාරම් 1997 දී රුපියල් දශ ලක්ෂ 18,307 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 20,192 දක්වා වැඩි විය.

ප්‍රතිව්‍යුහගත බැඳුම්කර ඇතුළත්ව බැංකු ක්‍රමය සතු වූ නොපියවූ ණය ප්‍රමාණය 1997 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 101,966 සිට රුපියල් දශ ලක්ෂ 100,903 දක්වා අඩු විය. ප්‍රතිව්‍යුහගත බැඳුම්කර හැර මුළු ණය ප්‍රමාණය, 1997 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 54,005 සිට සියයට 2 ක සුළු වශයෙන් අඩු වීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 52,942 ක් විය. 1998 දී වාණිජ බැංකු සතු වූ ණය ප්‍රමාණය වාර්තාගත ලෙස සියයට 7 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 71,753 ක් විය. මේ සඳහා විශේෂයෙන් හේතු වූයේ වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් මත නොපියවූ ණය ප්‍රමාණය 1997 දී පැවති රුපියල් දශ ලක්ෂ 30,857 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 14,850 දක්වා අඩු වීමය. 1998 දී වාණිජ බැංකුවල භාණ්ඩාගාර බැඳුම්කර මත නොපියවූ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,020 කින් වැඩි වූවද, විදේශ ව්‍යවහාර මුදල් ඒකකයන්ගෙන් (FCBUs) ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 හෙවත් රුපියල් දශ ලක්ෂ 6,773 ක ණයක් ලබා ගත්තද මුළු නොපියවූ ණය ප්‍රමාණය අඩු විය. මේ අතර, මහ බැංකුව සතු ණය ප්‍රමාණය 1997 දී රුපියල් දශ ලක්ෂ 24,999 සිට 1998 රුපියල් දශ ලක්ෂ 29,150 දක්වා වැඩි වූ අතර, මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ භාණ්ඩාගාර බිල්පත් මත රුපියල් දශ ලක්ෂ 2,266 කද තාවකාලික අත්තිකාරම් මත රුපියල් දශ ලක්ෂ 1,885 ක ද වගකීම් වැඩි වීමයි.

## විදේශීය ණය

මුළු විදේශීය ණය ප්‍රමාණය, 1997 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 383,116 සිට රුපියල් දශ ලක්ෂ 460,879 ක් දක්වා සියයට 20 ක වාර්තාගත වර්ධනයක් පෙන්නුම් කළේය. ශුද්ධ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 12,645 ක් සහ විදේශීය විනිමය විචලනයෙහි වැඩි වීම රුපියල් දශ ලක්ෂ 65,118 හේතුකොටගෙන නොපියවූ විදේශීය ණය වගකීම වැඩි විය. 1997 දී විදේශීය විනිමය විචලනය හේතුකොටගෙන නොපියවූ ණය ප්‍රමාණය වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 2,004 කිනි.

**8.8 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතිකයේ විචලනයන් විදේශීය ණය කෙරෙහි ඇතිකළ බලපෑම (අ)**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998(ආ) |
|---|---|---|---|---|---|
| දළ ලැබීම් | 19,384 | 24,359 | 23,992 | 24,642 | 30,996 |
| ආපසු ගෙවීම් | 7,606 | 8,477 | 8,939 | 10,004 | 18,351 |
| ශුද්ධ ලැබීම් | 11,778 | 15,882 | 15,053 | 14,638 | 12,645 |
| විනිමය අනුපාතිකයේ විචලනය- මත වගකීමේ වෙනස | 19,810 | 28,592 | -1,654 | 2,004 | 65,118 |
| කාලච්ඡේදය- අවසානයෙහි වගකීම | 301,812 | 346,286 | 359,685 | 383,116 | 460,879 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් සපයන ලද දත්ත ලැබූ දිනය අනුව වටිනාකම් සටහන් කිරීමේ ක්‍රමය පදනම් කොට ඇත.

(ආ) තාවකාලික

1998 දී සහනදායී ණය ප්‍රමාණය සියයට 23 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 445,916 ක් වූ අතර, 1997 හා සැසඳීමේදී එය සියයට 4 ක් විය. මුළු විදේශීය ණයෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කල ව්‍යාපෘති ණය 1997 දී පැවති සියයට 95 සිට 1998 දී සියයට 97 ක් විය. බහු පාර්ශ්වික ණය මුළු සහනදායී ණය වලින් සියයට 47 ක් වූ අතර, ඉතිරිය ද්විපාර්ශ්වික ණය වලින් සමන්විත විය. බහුපාර්ශ්වීය ණය ලබා ගත් ප්‍රධාන මූලාශ්‍ර අතර ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සංවර්ධන අරමුදල සහ කෘ.ස.ජා. අරමුදල වූ අතර ද්විපාර්ශවීය ණය ලබා ගත් ප්‍රධාන මූලාශ්‍ර වූයේ ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ජර්මනිය විය. ව්‍යාපෘති නොවන ණය රුපියල් දශ ලක්ෂ 14,941 ක් වූ අතර මෙය 1997 ට සාපේක්ෂව වැඩි වෙනසක් නොපෙන්වීය. 1998 දී ව්‍යාපෘති ණය සියයට 25 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 399,890 ක් වූ අතර, එය මුළු විදේශීය ණය වලින් සියයට 87 ක් විය. 1998 දී ජපානය රුපියල් දශ ලක්ෂ 11,960 ක් ලබා දෙමින් විශාලතම ද්විපාර්ශවීය ව්‍යාපෘති ණය සැපයුම්කරුවා වූ අතර ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන අරමුදල ඒකාබද්ධව රුපියල් දශ ලක්ෂ 14,086 කින් දායක විය. ව්‍යාපෘති නොවන ණය මුදල්, භාණ්ඩ සහ අනෙකුත් ණය 1997 දී රුපියල් දශ ලක්ෂ 61,994 සිට 1998 දී එය රුපියල් දශ ලක්ෂ 60,989 ක් දක්වා අඩු විය.

## රජයේ ණය සේවා ගෙවීම්

රජයේ ණය සේවා ගෙවීම් සියයට 24 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 114,866 ක් විය. මෙයින් රුපියල් දශ ලක්ෂ 59,968 ක් ණය ආපසු ගෙවීම් වූ අතර, එය මුළු ණය සේවා ගෙවීම් වලින් සියයට 52 ක් විය. පොලී ගෙවීම් සුළු වශයෙන් අඩු වී රුපියල් දශ ලක්ෂ 54,898 ක් විය. පොලී ගෙවීම් වර්තන වියදම්හි ප්‍රතිශතයක් ලෙස පෙර වර්ෂයේදී පැවති සියයට 29.9 සිට 1998 දී සියයට 27.5 දක්වා අඩු

**8.9 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය ණය සේවා ගෙවීම්**

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998(අ) |
|---|---|---|---|---|---|
| ණය සේවාකරණ ගෙවීම් | 66,213 | 77,663 | 81,263 | 92,519 | 114,866 |
| ණය ආපසු ගෙවීම් | 22,671 | 36,546 | 33,240 | 37,272 | 59,968 |
| දේශීය | 15,065 | 28,069 | 22,749 | 24,021 | 41,617 |
| විදේශීය | 7,606 | 8,477 | 10,491 | 13,251 | 18,351 |
| පොලී ගෙවීම් | 43,542 | 41,117 | 48,023 | 55,247 | 54,898 |
| දේශීය | 38,031 | 34,955 | 41,284 | 48,555 | 47,598 |
| කෙටිකාලීන | 18,712 | 13,947 | 18,053 | 18,174 | 12,398 |
| මධ්‍ය හා දිගුකාලීන | 16,699 | 21,008 | 23,231 | 30,381 | 35,200 |
| විදේශීය | 5,511 | 6,162 | 6,739 | 6,692 | 7300 |
| පොලී ගෙවීම්/වර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස | 34.26 | 26.67 | 27.42 | 29.90 | 27.50 |
| ණය සේවාකරණ ගෙවීම්/දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 11.43 | 11.63 | 10.57 | 10.39 | 11.32 |
| විදේශීය ණය සේවාකරණ ගෙවීම්/අපනයනවල ප්‍රතිශතයක් ලෙස | 8.27 | 7.50 | 7.60 | 7.27 | 8.37 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

විය. දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ණය සේවා ගෙවීම් පෙර වර්ෂයේදී පැවති සියයට 10.4 සිට 1998 දී සියයට 11.3 දක්වා වැඩි විය.

මුළු ණය ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 59,968 ක් වූ අතර එය රුපියල් දශ ලක්ෂ 41,617 ක දේශීය ණය සහ රුපියල් දශ ලක්ෂ 18,351 ක් වූ විදේශීය ණය ආපසු ගෙවීම් වලින් සමන්විත විය. 1998 දී දේශීය අංශයේ ණය ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 17,269 කින් වැඩි වූ අතර එයට ප්‍රධාන ලෙස විකල්ප කල් පිරීමේ කාලයන් සහිත වූ රුපියල් ණය මුල් කාලසීමාවේදී ගෙවා නිදහස් කිරීම හේතු විය. විදේශීය ණය ආපසු ගෙවීම්වල රුපියල් දශ ලක්ෂ 5,434 ක ආරක්ෂක සේවයේ මිලදී ගැනීම් සඳහා වූ ගෙවීමක් ද ඇතුළත් විය.

1998 දී දේශීය ණය සහ විදේශීය ණය සඳහා මුළු පොලී ගෙවීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 47,598 ක් සහ රුපියල් දශ ලක්ෂ 7,300 ක් විය. 1998 දී නොපියවූ මුළු දේශීය ණය ප්‍රමාණය සියයට 17 කින් වැඩි වුවත්, දේශීය ණය මත පොලී ගෙවීම් 1997 දී පැවැති රුපියල් දශ ලක්ෂ 48,565 ට සාපේක්ෂව රුපියල් දශ ලක්ෂ 48,440 දක්වා සුළු වශයෙන් අඩු විය. පහල පොලී අනුපාතිකයන් යටතේ රජයේ පොලී වියදම අඩු වීම පිළිබිඹු කරමින් 1998 දී භාණ්ඩාගාර බිල්පත් මත ගෙවූ පොලී වියදම් රුපියල් දශ ලක්ෂ 5,776 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 12,398 ක් විය. මේ අතර, මධ්‍ය හා දිගුකාලීන ණය සඳහා පොලිය රුපියල් දශ ලක්ෂ 4,819 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 35,200 ක් විය. විදේශීය ණය මත පොලී ගෙවීම් සියයට 9 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 7,300 ක් විය.